# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව

**විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඒ කලාපය තුළ සහ එහි සිට ව්‍යාපාර සහ වෙනත් ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා ලියාපදිංචි කිරීම, බලපත්‍ර දීම, බලය ලබාදීම සහ වෙනත් අනුමතයන් ලබා දීම සඳහා බලය ඇති කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; ඒ කලාපය තුළ ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව ප්‍රවර්ධනය කිරීම සඳහා ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නකු හඳුනාගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඒ කලාපය තුළ ක්‍රමෝපායික වැදගත්කමක් ඇති ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම් සහ වෙනත් නිදහස් කිරීම් නිශ්චය කොට ප්‍රදානය කිරීම සඳහා ද; විධිවිධාන සලස්වා ඇති ආකාරයට, ඒ කලාපය තුළ පිහිටා ඇති රජයේ අලෙවි කළ හැකි ඉඩම් සහ ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් සහ පරිශ්‍රයන් සහ සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් ගනුදෙනුවලට එළඹීමට ද; ඒ කලාපය තුළ, ජාත්‍යන්තර වෙළඳාම, නාවික ප්‍රවර්ධන මෙහෙයුම්, අක්වෙරළ බැංකු කටයුතු සහ මූල්‍ය සේවාවන්, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට දීම, සංස්ථාපිත මූලස්ථානයේ මෙහෙයුම්, කලාපීය බෙදාහැරීමේ මෙහෙයුම්, සංචාරක කටයුතු සහ ඒ හා සම්බන්ධ වෙනත් සේවාවන් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා ද; ඒ කලාපය තුළ, ජාත්‍යන්තර ආරාවුල් නිරාකරණය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ද; ඒ කලාපය තුළ, නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම සහ නේවාසික ප්‍රජාවක් පදිංචි කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා විසින්
2021 අප්‍රේල් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 මාර්තු මස 24 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[45 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : රු. 118.00 තැපැල් ගාස්තුව : රු. 45.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව

එල්. ඩී— ඕ. 4/2021

**විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඒ කලාපය තුළ සහ එහි සිට ව්‍යාපාර සහ වෙනත් ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා ලියාපදිංචි කිරීම, බලපත්‍ර දීම, බලය ලබාදීම සහ වෙනත් අනුමතයන් ලබා දීම සඳහා බලය ඇති කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; ඒ කලාපය තුළ ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව ප්‍රවර්ධනය කිරීම සඳහා ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නකු හඳුනා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඒ කලාපය තුළ ක්‍රමෝපායික වැදගත්කමක් ඇති ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම් සහ වෙනත් නිදහස් කිරීම් නිශ්චය කොට ප්‍රදානය කිරීම සඳහා ද; විධිවිධාන සලස්වා ඇති ආකාරයට, ඒ කලාපය තුළ පිහිටා ඇති රජයේ අලෙවි කළ හැකි ඉඩම් සහ ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් සහ පරිශ්‍රයන් සහ සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් ගනුදෙනුවලට එළඹීමට ද; ඒ කලාපය තුළ, ජාත්‍යන්තර වෙළඳාම, නාවික ප්‍රවර්ධන මෙහෙයුම්, අක්වෙරළ බැංකු කටයුතු සහ මූල්‍ය සේවාවන්, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට දීම, සංස්ථාපිත මූලස්ථානයේ මෙහෙයුම්, කලාපීය බෙදාහැරීමේ මෙහෙයුම්, සංචාරක කටයුතු සහ ඒ හා සම්බන්ධ වෙනත් සේවාවන් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා ද; ඒ කලාපය තුළ ජාත්‍යන්තර ආරාවුල් නිරාකරණය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ද; ඒ කලාපය තුළ, නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම සහ නේවාසික ප්‍රජාවක් පදිංචි කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

ජාතික යහපත පිණිස රජයේ සහ පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතු සම්බන්ධීකරණය කරන අතරතුර, රජයේ සහ පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතු මගින් රට සීඝ්‍රයෙන් සංවර්ධනය කිරීම සහතික කරනු ලැබිය යුතු බවට නියම කරන්නා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගැබ්ව ඇති රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සාක්ෂාත් කර ගැනීම පිණිස, මූලික වශයෙන් ම සේවා ආර්ථිකය විවිධාංගීකරණය කිරීම උදෙසා පහසුකම් සැලසීම සඳහා ඒ කලාපය තුළට විදේශ විනිමය ගලා ඒම ප්‍රවර්ධනය කිරීම සඳහා කාර්මික, වෘත්තීමය සහ ව්‍යවසායකත්ව නිපුණතාව වර්ධනය කිරීමට පහසුකම් සලසන

අතරම ඒ කලාපය තුළ නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම සම්බන්ධයෙන් සහ නේවාසික ප්‍රජාවක් පදිංචි කිරීම මඟින් ඒ කලාපය තුළ නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් පහසුකම් සැලසීම පිණිස නව ආයෝජන ආකර්ෂණය කරගනු ලබන, ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව ඇති, විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීමට අවශ්‍ය බව ශ්‍රී ලංකා රජය විසින් සැලකිල්ලට ගෙන ඇති හෙයින් ද;

ජාතික යහපත හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත සැලකිල්ලට ගෙන, ජාත්‍යන්තර වෙළඳාම, නාවික ප්‍රවර්ධන මෙහෙයුම්, අක්වෙරළ බැංකු කටයුතු සහ මූල්‍ය සේවාවන්, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට දීම, සංස්ථාපිත මූලස්ථානයේ මෙහෙයුම්, කලාපීය බෙදාහැරීම් මෙහෙයුම්, සංචාරක කටයුතු සහ ඒ හා සම්බන්ධ වෙනත් සේවාවන් ඇතුළු ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා ඒ කලාපය තුළ විශේෂිත යටිතල පහසුකම් සහ වෙනත් පහසුකම් ඇති ජාත්‍යන්තර ව්‍යාපාර සහ සේවා කේන්ද්‍රස්ථානයක් වන "කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීමට අවශ්‍ය වී ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2021 අංක    දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

I වන කොටස

## කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය සහ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පිහිටුවීම

**2.** (මෙහි මින්මතු "කොළඹ වරාය නගරය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවනු ලැබිය යුතු ය. මෙහි පිහිටුවනු ලබන කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය, මේ පනතේ I වන උපලේඛනයේ දක්වා ඇති මායිම්වලින් සමන්විත වන්නේ ය. කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය පිහිටුවීම

**3.** (1) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරන ව්‍යාපාර සහ වෙනත් මෙහෙයුම් හා සම්බන්ධ සියලු කාරණා මේ පනතේ දක්වා ඇති ආකාරයට පරිපාලනය කිරීම, නියාමනය කිරීම හා පාලනය කිරීම භාර (මෙහි මින්මතු "කොමිෂන් සභාව" කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පිහිටුවීම

යනුවෙන් සඳහන් කරනු ලබන) කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය යටතේ එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවට, මේ පනතේ දක්වා ඇති අරමුණු ද බලතල, කාර්ය සහ කර්තව්‍ය ද ඇත්තේ ය.

(4) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන්නා වූ, සියලු ප්‍රජා රීති සහ සංවර්ධන පාලන නියෝග පිළියෙල කිරීම, සැකසීම, සංශෝධනය කිරීම, යාවත්කාලීන කිරීම, පළ කිරීම සහ බලාත්මක කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වගකිව යුතු ය.

(5) කොමිෂන් සභාව විසින්, එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, යම් නියාමන අධිකාරියකට අදාළ වන ලිඛිත නීති මඟින් එසේ කිරීමට නියම කර ඇති අවස්ථාවක, ඒ නියාමන අධිකාරිය සතු හෝ ඊට පවරනු ලැබ ඇති විෂයයන් සම්බන්ධයෙන් මේ පනතේ නිශ්චිතව විධිවිධාන සලස්වා ඇති තාක් දුරට ඒ අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය ලබා ගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉල්ලා සිටිනු ලබන අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය ඒ නියාමන අධිකාරියට අදාළ වන ලිඛිත නීති කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සීමා විය යුතු ය.

(6) කොමිෂන් සභාව විසින් ඒ එකඟත්වය ඉල්ලා සිටිනු ලබන්නේ යම් අදාළ නියාමන අධිකාරියකින් ද, ඒ අදාළ නියාමන අධිකාරිය විසින්, අවස්ථානුගත කරුණු අනුව ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින්, ප්‍රමුඛත්වය ලබා දිය යුතු කරුණක් ලෙස සලකා, ඒ එකඟත්වය කොමිෂන් සභාව වෙත ලබා දෙනු ලැබිය යුතු ය.

(7) මේ පනතේ අන්‍යාකාරයකින් විශේෂිතව ම විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පනතේ කිසිවකින්, යම් ලිඛිත නීතියකින් යම් නියාමන අධිකාරියක් වෙත සතු කර දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය සම්බන්ධයෙන් කවර ආකාරයකින් හෝ සීමා කරනු ලබන ලෙසට සලකනු නොලැබිය යුතු ය.

කොළඹ වරාය නගරයේ ප්‍රධාන සැලැස්ම

4. (1) ජනාධිපතිවරයාගේ හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ප්‍රධාන සැලැස්ම, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සියලු කලාපකරණය සහ වෙනත් භෞතික සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු පදනම විය යුතු ය.

(2) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට කරගෙන යනු ලබන ව්‍යාපාරවල වැඩිදියුණුව සහතික කිරීම සඳහා, ව්‍යාපෘති සමාගම විමසා සහ ජනාධිපතිවරයාගේ හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කොමිෂන් සභාව විසින්, ජාතික යහපත හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස එහි ශක්‍යතාව අනුව ප්‍රධාන සැලැස්මට කිරීමට අවශ්‍ය යයි සලකනු ලබන යම් සංශෝධන වේ නම්, ඒ සංශෝධන හඳුනාගනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන සැලැස්ම සහ මේ පනත ප්‍රකාරව සාදනු ලැබිය යුතු සංවර්ධන පාලන නියෝග නිසි පරිදි ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීමේ වගකීම කොමිෂන් සභාවට පවරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය දැක්වෙන වාර්ෂික ප්‍රගති වාර්තාවක් ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින්, ව්‍යාපෘති සමාගම විමසා ප්‍රධාන සැලැස්මට කරනු ලැබිය යුතු යම් ප්‍රතිශෝධනයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ, ඒ වාර්ෂික ප්‍රගති වාර්තාව සමඟ, ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) ජාතික යහපත හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීමට අවශ්‍ය වේ නම්, ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින්, මේ වගන්තියේ කාර්ය සඳහා ඒ සාමාන්‍ය හෝ විශේෂ විධාන කොමිෂන් සභාව වෙත ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### කොමිෂන් සභාවේ අරමුණු සහ බලතල, කාර්ය සහ කර්තව්‍ය

කොමිෂන් සභාවේ අරමුණු

5. කොමිෂන් සභාවේ අරමුණු විය යුත්තේ -

(අ) කොළඹ වරාය නගරය, කලාපයේ ප්‍රමුඛ විශේෂ ආර්ථික කලාපයක් සහ ආකර්ෂණීය ආයෝජන මධ්‍යස්ථානයක් බවට ප්‍රවර්ධනය කිරීම;

(ආ) රට තුළට ඍජු විදේශ ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම;

(ඇ) සුරක්ෂිත සහ හිතකර ව්‍යාපාරික පරිසරයක් ඇති කිරීම සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව සඳහා පහසුකම් සැලසීම සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අදාළ ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය කලාපයේ වෙනත් ආකර්ෂණීය ආර්ථික කලාපවලට සමාන මට්ටමකින් පවත්වාගෙන යාමට වගබලා ගැනීම සඳහා ප්‍රයත්න දැරීම;

(ඈ) ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා එහි ව්‍යාපාරික මෙහෙයුම් සහ පරිපාලනය කාර්යක්ෂම ලෙස, විශ්වසනීය ලෙස සහ පාරදෘශ්‍ය ලෙස සිදු කිරීමේ පහසුව සහතික කිරීම;

(ඉ) ජාත්‍යන්තර වෙළඳාම, නාවික ප්‍රවර්ධන මෙහෙයුම්, අක්වෙරළ බැංකු කටයුතු සහ මූල්‍ය සේවාවන්, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට දීම, සංස්ථාපිත මූලස්ථානයේ මෙහෙයුම්, කලාපීය බෙදාහැරීමේ මෙහෙයුම්, සංචාරක කටයුතු සහ ඒ හා සම්බන්ධ වෙනත් සේවාවන් තුළ ගෝලීය සහ කලාපීය ආයෝජන සිදු කිරීම දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඊ) නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සහ වර්ධනය කිරීම;

(උ) තීරු බදු රහිත සාප්පු, විනෝදාත්මක කටයුතු සහ ඒ හා සමාන වෙනත් පහසුකම් සැලසීම මගින් සංචාරක කටයුතු සහ ඒ හා සම්බන්ධ සේවාවන් ප්‍රවර්ධනය කිරීම;

(ඌ) රැකියා අවස්ථා ඇති කිරීම;

(එ) තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම; සහ

(ඒ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ නේවාසික ප්‍රජාවක් පදිංචි කරවීම මඟින් නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම,

වන්නේ ය.

කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**6.** (1) කොමිෂන් සභාව විසින්, ජාතික යහපත හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත සාක්ෂාත් කර ගැනීම සඳහා, පහත දක්වා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු යː-

(අ) මේ පනත ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල යෙදීම සඳහා ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් සහ වෙනත් අනුමතයක් නිකුත් කිරීම හෝ ප්‍රදානය කිරීම සහ ව්‍යාපාර සහ ආයෝජන සඳහා පහසුකම් සැලසීම;

(ආ) කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරිදි, අදාළ නියාමන අධිකාරීවල එකඟත්වය ඇතිව, මේ පනත ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරන සියලු ආයෝජන සහ ව්‍යාපාර සම්බන්ධයෙන් වන සමස්ත නියාමන අධීක්ෂණය සහ පාලනය සඳහා පහසුකම් සැලසීම සහ එය ක්‍රියාත්මක කිරීමː

එසේ වුව ද, අදාළ නියාමන අධිකාරියෙන් ඉල්ලා සිටිනු ලබන ඒ එකඟත්වය, ඒ එක් එක් අධිකාරියට අදාළ වන ලිඛිත නීති කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය ඇතුළත ක්‍රියාත්මක කිරීමට සීමා විය යුතු ය;

(ඇ) මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් අදාළ ලිඛිත නීතිවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද රජයේ අලෙවි කළ හැකි ඉඩම් බද්දට දීම;

(ඈ) මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් අදාළ ලිඛිත නීතිවලට යටත්ව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම්, ඒ ඉඩම්වලට අදාළ ප්‍රධාන බදු දරන්නා වූ ව්‍යාපෘති සමාගම සමඟ එක්ව බද්දට දීම;

(ඉ) මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් අදාළ ලිඛිත නීතිවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද රජයේ අලෙවි කළ හැකි ඉඩම් මත පිහිටා ඇති සහාධිපත්‍ය කොටස් අවස්ථාවෝචිත පරිදි, අදාළ ආයෝජකයා හෝ සංවර්ධකයා සමඟ එක්ව බදු දීම හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම;

(ඊ) මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් අදාළ ලිඛිත නීතිවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් මත පිහිටා ඇති සහාධිපත්‍ය කොටස් ඒ ඉඩම්වල ප්‍රධාන බදු දරන්නා වූ ව්‍යාපෘති සමාගම සමඟ එක්ව බදු දීම හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම;

(උ) ආයෝජකයන් සඳහා වන එකම සම්බන්ධීකාරකයා වෙමින් ඒකීය ආයෝජන පහසුකම් සලසන්නා ලෙස කටයුතු කිරීම සහ අදාළ නියාමන අධිකාරියට අදාළ වන ලිඛිත නීති මගින් නියම කරනු ලබන අවස්ථාවක, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාරවල නිරත වීම සඳහා අවශ්‍ය වන සියලු ලියාපදිංචි කිරීම්, බලපත්‍ර, බලය ලබාදීම් සහ වෙනත් අනුමතයන් ඉක්මණින් ලබා දීමට පහසුකම් සැලසීම සහ ඒවා ඉක්මණින් නිකුත් කිරීම මඟින් ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව ප්‍රවර්ධනය කිරීම:

(උ) ඒකීය ආයෝජන පහසුකම් සලසන්නා ලෙස කටයුතු කරමින්, මේ පනතේ VI වන කොටස ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාරවල නිරත වීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන යෝජනා ඇගයීම ඒ සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, අනුමත කිරීම හෝ මේ පනතේ දක්වා ඇති පරිදි අනුමතයන් සඳහා පහසුකම් සැලසීම ;

(එ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සංවර්ධන කටයුතුවල නිරතවීම සඳහා ද ව්‍යාපාර, සාප්පු සවාරි, සූදු ක්‍රීඩා කටයුතු ඇතුළු විනෝදස්වාද ක්‍රියා සහ වෙනත් යම් පහසුකම් ක්‍රියාත්මක කිරීම සඳහා ද, වාණිජමය නේවාසික පහසුකම්වල භුක්තිය ලබා ගැනීම සඳහා ද අවශ්‍ය විය හැකි වෙනත් සියලු අවසරපත්‍ර, නිෂ්කාශන, වැඩ කිරීමේ අවසරපත්‍ර සහ වෙනත් යම් අනුමතයන් සැලසුම් කිරීම, නිකුත් කිරීම සහ ඊට අනුකූලව කටයුතු කර ඇත්ද යන්න අධීක්ෂණය කිරීම;

(ඒ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අවශ්‍ය විය හැකි පරිදි පාරිසරික ප්‍රමිතීන් සකස් කිරීම සහ අනුමත කිරීම සහ පාරිසරික සංවර්ධනයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඃ

(ඔ) ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි යම් විධානවලට යටත්ව සහ ප්‍රධාන සැලැස්මට සහ නියම කරනු ලැබිය හැකි සංවර්ධන පාලන නියෝගවලට අනුකූලව, (මේ පනතේ X වන කොටසේ විධිවිධානවලට අනුකූලව

සභාධිපත්‍ය කොටස් ඉදිකිරීම ද ඇතුළුව) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු, ක්‍රියාකාරකම් සහ සේවාවන් සිදු කරන බවට වගබලා ගැනීම;

(ඕ) එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටුකිරීමේ දී අවශ්‍ය විය හැකි පරිදි, යම් තැනැත්තකු සමඟ ගිවිසුම්වලට එළඹීම;

(ක) එහි අරමුණු ඉටු කර ගැනීම සහ එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය සහ ව්‍යාපාර මධ්‍යස්ථාන, නියාමකයන් සහ වෙනත් මණ්ඩල, ආයතන, සංවිධාන සහ තැනැත්තන් සමඟ සහයෝගීව කටයුතු කිරීම සහ ඔවුන් සමඟ ගිවිසුම්වලට එළඹීම;

(ග) කොමිෂන් සභාව විසින් කෙළින්ම හෝ දේපළ කළමනාකරු මඟින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සපයනු ලබන සේවාවන් සහ පහසුකම් සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ගාස්තු අය කිරීම සහ වෙනත් අය කිරීම් සිදු කිරීම;

(ච) කොමිෂන් සභාව විසින් හෝ දේපළ කළමනාකරු මඟින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සපයනු ලබන යම් සේවාවක් හෝ පහසුකමක් සම්බන්ධයෙන් කොන්දේසි හෝ නියමයන් පැනවීම සහ විධාන නිකුත් කිරීම;

(ජ) නියම කරනු ලැබිය යුතු අනුප්‍රමාණ මත, මේ පනතින් බලය දෙනු ලබන පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන දේශීය තක්සේරු වරිපනම් සහ වෙනත් අය බදු හඳුනා ගැනීම;

(ට) නියම කරනු ලැබිය හැකි නියම, කොන්දේසි සහ කාර්ය පටිපාටිවලට යටත්ව, බලයලත් තැනැත්තන් විසින්, නම් කරන ලද යම් විදේශ ව්‍යවහාර මුදලකින් වෙළඳ කටයුතු සිදු කිරීම සඳහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යම් ව්‍යාපාර වස්තු, වටිනා ලෝහ හෝ භාණ්ඩ හුවමාරුවක් හෝ වෙළඳපළක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ඩ) බලයලත් තැනැත්තකු ලෙස ලියාපදිංචි වීම සඳහා යම් සමාගමක් හෝ තැනැත්තකු විසින් කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි ලේඛන හෝ තොරතුරු ඉල්ලා සිටීම;

(ණ) බලයලත් තැනැත්තකුගේ ඉල්ලීම පරිදි සහ කොමිෂන් සභාවේ අභිමතය පරිදි, යම් ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් යම් අනුමතයක් තාවකාලිකව අත්හිටුවීම, සංශෝධනය කිරීම, මාරු කිරීම, පැවරීම, අලුත් කිරීම හෝ ආපසු භාර දීම පිළිගැනීම;

(ත) බලයලත් තැනැත්තකු විසින් සැලකිය යුතු පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද යම් ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ අනුමතයක් සංශෝධනය කිරීම, අවලංගු කිරීම, අත්හිටුවීම හෝ අහෝසි කිරීම;

(ද) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වීම සඳහා, නියම කරනු ලැබිය හැකි සියලු ප්‍රජා රීති සහ සංවර්ධන පාලන නියෝග සෑදීම, සැකසීම, සංශෝධනය කිරීම, යාවත්කාලීන කිරීම, පළ කිරීම සහ බලාත්මක කිරීම;

(න) මේ පනත ප්‍රකාරව නියම කරනු ලැබිය යුතු යයි නියමිත කාරණා සම්බන්ධයෙන් නියෝග සම්පාදනය කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ප) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ විය යුතු, කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නිසි පරිදි පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය විය හැකි මේ පනතේ දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් රීති සහ සංග්‍රහ සෑදීම සහ කාර්යපටිපාටි සහ ප්‍රමිති නිශ්චිතව දැක්වීම සහ විධාන සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(බ) මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි, බලයලත් තැනැත්තකු සම්බන්ධයෙන් වන යම් වාණිජ ආරවුලක් ඉක්මනින් විසඳා ගැනීම සඳහා පහසුකම් සැලසීම;

(ම) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අදාළ යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සෑදීමට අදාළ නිර්දේශ ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම;

(ය) ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටින පරිදි, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අදාළ යම් නිශ්චිත කාරණයක් සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කිරීම;

(අඅ) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා, කොමිෂන් සභාවේ මෙහෙයුම්, ආදායම් සහ වියදම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත සහ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම;

(ආඅ) ජනාධිපතිවරයා හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විමසා, අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම, ඉවත් කිරීම සහ ඔහු සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ වැටුප් සහ වෙනත් යම් දීමනා ද ඇතුළු ඔහුගේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීම සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කොමිෂන් සභාවේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවීම;

(ඇඅ) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඔවුන්ගේ වැටුප්, වේතන සහ වෙනත් යම් දීමනා ද ඇතුළු ඔවුන්ගේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීම;

(ඈඅ) ජනාධිපතිවරයා හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විමසා, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ ප්‍රමාණයට, කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සහාය වීම සඳහා අවශ්‍ය විය හැකි

විශේෂඥයන් හෝ උපදේශකවරයන් සේවයේ යෙදවීම සහ කොමිෂන් සභාවේ අරමුදලෙන් ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම;

(ඉඅ) කොමිෂන් සභාවේ මෙහෙයුම් හෝ පරිපාලනමය කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් කාර්යාලයක් සහ වෙනත් ස්ථානයක් කොමිෂන් සභාවේ නමින් දැරීම, බද්දට හෝ කුලියට ගැනීම;

(ඊඅ) මේ පනත ප්‍රකාරව, නියම කරනු ලැබිය හැකි නියෝගවලට යටත්ව කොමිෂන් සභාවේ අරමුදල කළමනාකරණය කිරීම, ආයෝජන කිරීම, බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සහ අරමුදල් ණයට ගැනීම සහ කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය අනුමත කිරීම සහ කළමනාකරණය කිරීම;

(උඅ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිදු කරන සූදු ක්‍රීඩා කටයුතු නියාමනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවල ඒ කටයුතු කළමනාකරණය කිරීම සඳහා නියෝග සෑදීම;

(ඌඅ) සභාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ බද්ධ නිවාස අයිතිකම් යන විෂයයන් හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කර්තව්‍යයක් 2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාර සංස්ථාගත කොට, මේ පනතේ 59 වන වගන්තිය ප්‍රකාර දේපළ කළමනාකරු යනුවෙන් නම් කරන ලද සමාගමට පැවරීම හෝ භාර කිරීම; සහ

(එඅ) සාමාන්‍යයෙන් මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු, කොමිෂන් සභාවට ලබා දෙන ලද හෝ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් අනුභූතික වූ හෝ ආනුෂංගික වූ වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා කොළඹ වරාය නගරයට අදාළ ප්‍රවර්ධන කටයුතුවල නිරත වන විට දී, ඒ ප්‍රවර්ධන කටයුතුවලට අදාළ වාර්තා චිත්‍රපට සැකසීමේ දී, එහි අන්තර්ගතය පිළියෙල කිරීමේ දී, එය නිර්මාණය කිරීමේ දී සහ තොරතුරු තාක්ෂණ සහාය ලබා ගැනීමේ දී ඒ තුළ හැකිතාක් දුරට දේශීය අන්තර්ගතයක් ඇති බවට ද දේශීය කුසලතාවල සහ නිපුණතාවල සහභාගීත්වයක් ඇති බවට ද කොමිෂන් සභාව විසින් වගබලා ගත යුතු ය.

## III වන කොටස

## කොමිෂන් සභාවේ සංයුතිය සහ එහි කටයුතු පරිපාලනය සහ කළමනාකරණය

*කොමිෂන් සභාවේ සංයුතිය සහ එහි සභාපතිවරයා පත් කිරීම*

7. (1) කොමිෂන් සභාව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පස් දෙනෙකුට නොඅඩු වූ ද හත් දෙනෙකුට නොවැඩි වූ ද සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය. ඒ පත්වීම් සිදු කිරීමේ දී, ඒ සාමාජිකයන් සතුව, ආයෝජනය, මූල්‍ය, නීතිය, තොරතුරු තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, ව්‍යාපාර හෝ ගිණුම්කරණය යන ක්ෂේත්‍රවල අදාළ දැනුම, නිපුණත්වය සහ පළපුරුද්ද සහ ජාතික හෝ ජාත්‍යන්තර පිළිගැනීම ඇති බවට වගබලා ගැනීම සම්බන්ධයෙන් සැලකිල්ල යොමු කරනු ලැබිය යුතු ය. ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයන් අතරින් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීමේ දී, කොමිෂන් සභාවේ සංයුතියෙන්, අදාළ දැනුම, නිපුණත්වය සහ පළපුරුද්ද සහ ජාතික හෝ ජාත්‍යන්තර පිළිගැනීම නියෝජනය වන බවට වගබලා ගැනීම සම්බන්ධයෙන් සැලකිල්ල යොමු කරනු ලැබිය යුතු ය.

*ධුර කාලය*

8. කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් මියයාම, ඉල්ලා අස්වීම හෝ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ඉවත් කිරීම හේතුවෙන් කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, ඔවුන් පත් කරනු ලබන දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු ය.

*නැවත පත් කිරීම, ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම ආදිය*

9. (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් මෙහි (3) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කර ඇත්නම් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(2) කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ සාමාජිකයකු විසින් තත්කාර්ය සඳහා ජනාධිපතිවරයා හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා අමතා

යවනු ලබන ලිඛිත සන්නිවේදනයක් මඟින් සිය ධුරයෙන් ඉල්ලා අස් වනු ලැබිය හැකි අතර, ජනාධිපතිවරයා විසින් හෝ ඒ අමාත්‍යවරයා විසින් ඒ ඉල්ලා අස්වීම භාර ගනු ලැබීමෙන් පසු ඒ ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් -

(අ) රෝගාතුර වීම හේතුවෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු සිය ධුරයේ කාර්ය ඵලදායක ලෙස ඉටු කිරීමට නොහැකි වන්නේ නම්, ලිඛිත දැන්වීමක් මඟින්; හෝ

(ආ) සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු එසේ පත් කරනු ලැබූ දින සිට නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වස්තුභංගත්වයට පත්ව ඇති බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් හෝ අපරාධ වරදක් සඳහා වරදකරුවකු කරනු ලැබ ඇත්නම්, වහාම ක්‍රියාත්මක වන පරිදි; හෝ

(ඇ) කරන ලද කරුණු ඉදිරිපත් කිරීම් පිළිබඳ සලකා බැලීමෙන් පසු, සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු වංචාව, බරපතළ විෂමාචාරය හෝ දැඩි නොසැලකිල්ල සම්බන්ධයෙන් වරදකරුවකු වන බවට ද ඒ හේතුවෙන් ඔහු වහාම ක්‍රියාත්මක වන පරිදි ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු බවට ද තමා සෑහීමට පත් වේ නම්,

ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ සාමාජිකයකු ධුරය හිස් කරනු ලැබූ විට, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ජනාධිපතිවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලබන තැනැත්තා එකී ධුරය හිස් කරනු ලැබූ සභාපතිවරයා හෝ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතුය.

(5) රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ

සාමාජිකයකු සැලකිය යුතු කාලයක් සිය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා නොපැමිණෙන කාලය තුළ ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා ලෙස කටයුතු කිරීමට ජනාධිපතිවරයා විසින් වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ රැස්වීම් සහ ගණපූරණය

**10.** (1) කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් එහි රැස්වීම්වල මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා කොමිෂන් සභාවේ යම් රැස්වීමකට නොපැමිණ ඇති අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සියලු ප්‍රශ්න එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ රැස්වීමක් -

(අ) ඒ රැස්වීම සඳහා නියම කර ගත් ස්ථානයේ, දිනයේ සහ වේලාවේ රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) ඒ රැස්වීම පැවැත්වෙන කාලසීමාව තුළ, ඊට සහභාගී වන ගණපූරණය සංයුක්ත කරන සියලුම සාමාජිකයන්ට ඊට සහභාගී වන එක් එක් සාමාජිකයා එකවර දැකිය හැකි සහ ඒ එක් එක් සාමාජිකයාට සවන් දිය හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයක් මඟින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් වන රීති ද, කොමිෂන් සභාවට කොළඹ වරාය

නගරයේ බල ප්‍රදේශය තුළ සිය දෛනික කටයුතු සම්බන්ධයෙන් මඟපෙන්වීම සඳහා අවශ්‍ය වන ප්‍රජා රීති ද සාදනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයකුගේ පුරප්පාඩුවක් පැවතීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් අවලංගු නොවිය යුතු බව

**11.** කොමිෂන් සභාවේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් අවලංගු නොවිය යුතු ය; නැතහොත් අවලංගු යයි සලකනු නොලැබිය යුතු ය.

සභාපතිවරයාගේ සහ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**12.** කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ එහි අනෙකුත් සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ජනාධිපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇති යම් තැනැත්තකු සම්බන්ධයෙන් සභාපතිවරයාට හෝ සාමාජිකයකුට යම් සබඳතාවක් ඇත්නම් අදාළ වන කාර්යපටිපාටිය

**13.** (1) යම් බලයලත් තැනැත්තකු සම්බන්ධයෙන් කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් යම් සබඳතාවක් ඇති කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු විසින් වහාම ඒ සබඳතාවේ ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. ඉන්පසු, ඒ සබඳතාවට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් අදාළ වන යම් තීරණයකට ඒ සාමාජිකයා සහභාගී වනු හෝ ඊට ඡන්දය ප්‍රකාශ කරනු නොලැබිය යුතු ය.

(2) යම් බලයලත් තැනැත්තකු සම්බන්ධයෙන් කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් යම් සබඳතාවක් ඇති කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු යම් තීරණයකට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් සහභාගී වුවහොත්, ඒ තීරණය බලරහිත කළ හැකි වන්නේ ය.

කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ අරමුදල කළමනාකරණය කරනු ලැබිය යුතු බව

**14.** (1) කොමිෂන් සභාව, එහි කටයුතු සම්බන්ධයෙන් වන මූල්‍ය කළමනාකරණය සහ මේ පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද අරමුදල නිසි පරිදි මෙහෙයවීම සහ කළමනාකරණය භාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වන කර්තව්‍ය ඉටු කිරීමේ දී, කොමිෂන් සභාව විසින්, මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි සහ නියම කරනු ලැබිය හැකි නියෝගවලට යටත්ව, ආයෝජන කිරීම, බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සහ අරමුදල් ණයට ගැනීම සහ කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය අනුමත කිරීම සහ කළමනාකරණය කිරීම කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම

**15.** (1) කොමිෂන් සභාවේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය. මේ වගන්තියේ කාර්ය සඳහා, එසේ පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයා ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනයක් විය හැකි ය.

(2) අවසාන විගණන වාර්තාව, පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබීම සඳහා, ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

පොත් සහ ගිණුම් පවත්වාගෙන යාම

**16.** (1) කොමිෂන් සභාව විසින්, අදාළ වන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව, පොත්, ලේඛන සහ සටහන්, ගිණුම්, මුදල් සුරැකුම්, වවුචරපත්, සහ වෙනත් ලේඛනවල වාර්තා පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශයක් පිළියෙළ කළ යුතු ය. එසේ ම, කොමිෂන් සභාව විසින් වාර්ෂිකව, ස්වකීය මූල්‍ය ප්‍රකාශය විගණනය කොට ඒ පිළිබඳව වාර්තා කිරීමට ද එසේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයෙන්, සිය මතය අනුව, කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ දැක්මක් පෙන්නුම් කෙරෙන්නේ ද යන්න ප්‍රකාශ කිරීමට ද ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනයක් පත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව විසින් තොරතුරු කැඳවීම

**17.** කොමිෂන් සභාව විසින්, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි තොරතුරු සහ වාර්තා අවශ්‍ය අවස්ථාවල දී කැඳවනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම

**18.** කොමිෂන් සභාව විසින්, මේ පනත යටතේ වන සිය බලතල, කාර්ය සහ කර්තව්‍ය අතරින් කොමිෂන් සභාව විසින් නිශ්චය කරන පරිදි වන බලතල, කාර්ය සහ කර්තව්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට, කොමිෂන් සභාවේ යම් නිලධරයකුට හෝ කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන යම් වගකීම් සහගත තනතුරක් දරන තැනැත්තකුට, පවරා දෙනු ලැබිය හැකි අතර, ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොමිෂන් සභාවේ නිලධරයා හෝ කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන වගකීම් සහගත තනතුරක් දරන තැනැත්තා විසින් කොමිෂන් සභාවේ විධානයට සහ අධීක්ෂණයට යටත්ව, එසේ පවරා දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ පරිපාලන ඒකක

**19.** (1) කොමිෂන් සභාව විසින්, මේ පනත ප්‍රකාරව වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට අවශ්‍ය විය හැකි යම් පරිපාලන ඒකක සංඛ්‍යාවක් කොමිෂන් සභාව තුළ පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය අතරින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි බලතල, කාර්ය සහ කර්තව්‍ය යම් පරිපාලන ඒකකයකට හෝ කොමිෂන් සභාවේ සේවානියුක්තයකුට, කලින් කල ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, ඒ යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය පවරනු ලැබ ඇති ඒ පරිපාලන ඒකකය හෝ සේවානියුක්තයා ඒ සම්බන්ධයෙන් වගකිව යුතු අතර, කොමිෂන් සභාවේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධානයට සහ අධීක්ෂණයට යටත්ව ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව, එහි නිලධරයන් සහ අනෙකුත් සේවා නියුක්තයන් සද්භාවයෙන් කරන ලද ක්‍රියාවලට වගකිව යුතු නොවන බව

**20.** මේ පනත යටතේ කොමිෂන් සභාව, එහි නිලධරයන් සහ සේවානියුක්තයන් විසින් සිය බලතල, කාර්ය හෝ කර්තව්‍ය සද්භාවයෙන් ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව, ඒ නිලධරයන් සහ සේවානියුක්තයන් වගකියනු නොලැබිය යුතු ය. එසේ වුව ද, ඒ මුක්තිය -

(අ) තත් කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ අපරාධමය වරදක් සඳහා වූ වගකීම දක්වා;

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් අදාළ ලිඛිත නීතියක විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානවලට පටහැනිව කරනු ලබන යම් ක්‍රියාවක් දක්වා,

දීර්ඝ කරනු නොලැබිය යුතු ය.

යම් සිවිල් හෝ අපරාධ නඩුකරයක දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම්

**21.** යම් අධිකරණයක් හෝ මේ පනත ප්‍රකාරව පිහිටුවන ලද ජාත්‍යන්තර වාණිජ ආරවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය හෝ වෙනත් යම් ආයතනයක් ඉදිරියේ කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව ගෙන එනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුකරයක දී කොමිෂන් සභාව විසින් දරනු ලබන යම් වියදමක් කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, ඒ සිවිල් හෝ අපරාධ නඩුකරයේ දී කොමිෂන් සභාවට ගෙවන ලද හෝ කොමිෂන් සභාව විසින් ප්‍රතිපූරණය කරගනු ලැබූ යම් පිරිවැයක් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

යම් සිවිල් හෝ අපරාධ නඩුකරයක දී කොමිෂන් සභාවේ සාමාජිකයකු, නිලධරයකු ආදීන් විසින් දරනු ලබන වියදම්

**22.** යම් අධිකරණයක් හෝ මේ පනත ප්‍රකාරව පිහිටුවන ලද ජාත්‍යන්තර වාණිජ ආරවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය හෝ වෙනත් යම් ආයතනයක් ඉදිරියේ කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් මේ පනත ප්‍රකාරව හෝ කොමිෂන් සභාවේ විධානය මත හෝ කරන ලද හෝ කරනු ලැබූ බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට එරෙහිව ගෙන එනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුකරයක දී ඒ තැනැත්තා විසින් දරනු ලබන යම් වියදමක් කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, ඒ යම් සිවිල් හෝ අපරාධ නඩුකරයක දී කොමිෂන් සභාවට ගෙවන ලද හෝ කොමිෂන් සභාව විසින් ප්‍රතිපූරණය කර ගන්නා ලද යම් පිරිවැයක් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ ක්‍රියාව සද්භාවයෙන් නොකරන ලද බවට ඒ අධිකරණය හෝ ජාත්‍යන්තර වාණිජ ආරවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය හෝ ආයතනය තීරණය කරයි නම්, කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවන ලද ඒ වියදම ඒ තැනැත්තාගෙන් ආපසු අය කරගෙන කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### කොමිෂන් සභාවේ අරමුදල

කොමිෂන් සභාවේ අරමුදල

**23.** (1) කොමිෂන් සභාව සතුව අරමුදලක් තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ අරමුදලට පහත සඳහන් මුදල් ප්‍රමාණ ගෙවනු ලැබිය යුතු ය:-

(අ) මේ පනත ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් දරනු ලැබිය හැකි, කොළඹ වරාය නගරයේ සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රවර්ධන වියදම් සහ වෙනත් යම් වියදම් ද ඇතුළුව, කොමිෂන් සභාවේ ආරම්භක පිහිටුවීමේ සහ මෙහෙයුම් වියදම් පියවීම සඳහා කොමිෂන් සභාව විසින් භාවිත කරනු ලැබිය යුතු මුදල් ප්‍රමාණයක් වන්නා වූ, වෙනත් කරුණු අතර, කොමිෂන් සභාව විසින් කොළඹ වරාය නගරයේ ආයෝජන පහසුකම් සලසන්නාගේ කර්තව්‍ය ඉටු කිරීම හේතුවෙන් මූලික දායක මුදල වශයෙන්, ව්‍යාපෘති සමාගම විසින් කොමිෂන් සභාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ශ්‍රී ලංකා රුපියල් මිලියන හාරසියයක් වන මුදලක්;

(ආ) මේ පනත ආරම්භ වන දින සිට 2028 ජූනි මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටි අලෙවි කළ හැකි ඉඩම් සම්බන්ධයෙන්, වෙනත් කරුණු අතර, කොමිෂන් සභාව විසින් ආයෝජන පහසුකම් සලසන්නාගේ කර්තව්‍ය ඉටු කිරීම වෙනුවෙන් ඉහත (අ) ඡේදය ප්‍රකාරව ව්‍යාපෘති සමාගම විසින් යොදවන ලද ආරම්භක දායක මුදල සහ ඒ මත ගෙවිය යුතු යම් බදු මුදල් අඩු කිරීමෙන් පසු, මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව විසින් දරන ලද (අ) ඡේදයේ දක්වා ඇති වියදම පියවීම සඳහා කොමිෂන් සභාව විසින් භාවිත කරනු ලැබිය යුතු මුදල් ප්‍රමාණය වන්නා වූ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටි ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් බදු දීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට සමාන සියලු මුදල් ප්‍රමාණ (කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති සමාගමේ ඉඩම් හා සම්බන්ධ බදුකර ලියා අත්සන් කිරීමට සමගාමීව එසේ ලැබුණු මුදල්වල සමස්ත ශේෂය ව්‍යාපෘති සමාගම වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය);

(ඇ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති, රජයේ අලෙවි කළ හැකි යම් ඉඩම් බද්දට දීමෙන් 2023 ජූලි මස 1 වන දින සිට 2028 ජූනි මස 30 වන දින දක්වා වන කාලසීමාව තුළ ලැබෙන කොළඹ වරාය නගරයේ සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රවර්ධන වියදම් වෙනුවෙන්

කොමිෂන් සභාව විසින් දරන ලද වියදම් පියවීමට සේවා ගාස්තුවක් ලෙස කොමිෂන් සභාව විසින් රඳවා ගනු ලැබූ සියලු මුදල්වලින් සියයට එකක ප්‍රතිශතයකට (1%) සමාන සියලු මුදල් ප්‍රමාණ; (අදාළ බදු ගිවිසුම් ලියා අත්සන් කිරීමට සමගාමීව කොමිෂන් සභාව විසින් එසේ ලැබුණු සියලු මුදල් ප්‍රමාණවල සම්පූර්ණ ශේෂය ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, එවිට එය රජයේ ආදායමේ කොටසක් වන්නේ ය.);

(ඇ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ, මේ පනත යටතේ නියම කර ඇති නිශ්චිත අනුප්‍රමාණයන්ගෙන් කොමිෂන් සභාව විසින් අයකර ගනු ලබන දේශීය තක්සේරු වරිපණම් සහ පනවනු ලබන වෙනත් යම් අයබදු වශයෙන් කොමිෂන් සභාව වෙත ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ (ඒ මුදල් ප්‍රමාණ කාර්තු පදනමක් මත ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, එය රජයේ ආදායමේ කොටසක් වන්නේ ය.);

(ඉ) මේ පනත ප්‍රකාරව, කොමිෂන් සභාව හෝ දේපළ කළමනාකරු වෙත පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සපයනු ලබන සියලු සේවාවන් හෝ පහසුකම් සඳහා කොමිෂන් සභාව හෝ දේපළ කළමනාකරු විසින් පනවනු ලැබිය හැකි ගාස්තු හෝ අයකිරීම් ලෙස කොමිෂන් සභාවට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ;

(ඊ) දේශීය හෝ විදේශීය යම් නීත්‍යානුකූල ප්‍රභවයකින් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා කොමිෂන් සභාවට ලැබෙන සියලු ප්‍රදාන, පරිත්‍යාග, ත්‍යාග හෝ රික්තවරණ;

(උ) තත් කාර්යය සඳහා සාදනු ලැබිය යුතු නියෝගවලට අනුකූලව කොමිෂන් සභාව විසින් ණයට ගනු ලබන සියලු මුදල් ප්‍රමාණ; සහ

(ඌ) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව වෙත උපචිත වන වෙනත් යම් මුදල් ප්‍රමාණ.

(3) කොමිෂන් සභාව විසින් -

(අ) කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහසම්බන්ධ වූ ජාත්‍යන්තර ප්‍රවර්ධන කටයුතු, (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ දක්වා ඇති අදාළ සීමා කිරීමට අනුකූල වන බවට ද;

(ආ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ව්‍යාපෘති සමාගම වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ශේෂය එසේ ප්‍රේෂණය කරනු ලබන බවට ද; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු සියලු මුදල් එසේ බැර කරනු ලබන බවට ද,

තහවුරු කරන අතරතුර, මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව විසින් සිය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් ප්‍රමාණ කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ අරමුදල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය. මේ වගන්තියේ කාර්ය සඳහා එසේ පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයා ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනයක් විය හැකි ය.

(5) අවසාන විගණන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබීම සඳහා, ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) 2028 ජූලි මස 1 වන දින වන විට ස්වයං අරමුදල් සම්පාදනය සඳහා කොමිෂන් සභාව ඉලක්ක කළ යුතු බවට මෙයින් සඳහන් කරනු ලැබේ.

(7) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රවර්ධන කටයුතු කරගෙන යාමේ දී සහ ඒ සම්බන්ධ වියදම් දැරීමේ දී, ජාත්‍යන්තර සහ දේශීය විශේෂඥතාව සහ දක්ෂතා යන දෙකම යොදා ගැනීමට කොමිෂන් සභාව වගබලා ගත යුතු ය.

## V වන කොටස

### කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම

**24.** (1) කොමිෂන් සභාව විසින්, ජනාධිපතිවරයා විමසා සහ ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, යම් සුදුසුකම් සහ පළපුරුද්ද ද, දේශීය හෝ ජාත්‍යන්තර අත්දැකීම් ද සතු (මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විමසා සහ ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් නියම සහ කොන්දේසි මත, පත් කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ වගන්තියේ (6) වන උපවගන්තිය ප්‍රකාරව ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලබන්නේ ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොමිෂන් සභාවේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, කොමිෂන් සභාවේ සියලු කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(5) ජනාධිපතිවරයා විමසා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමික අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

(6) ජනාධිපතිවරයා විමසා සහ ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, කොමිෂන් සභාව විසින්, හේතු දක්වා අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) ජනාධිපතිවරයා සහ කොමිෂන් සභාව වෙත ඒ සම්බන්ධයෙන් කරනු ලබන ලිඛිත සන්නිවේදනයක් මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් භාරගත් විට බලාත්මක විය යුතු ය.

(8) මේ පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉවත් කිරීම සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**25.** අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත පරිදි විය යුතු ය:-

(අ) කොමිෂන් සභාව සඳහා වෙනම ලේකම් කාර්යාලයක් පිහිටුවීම සහ කළමනාකරණය සහ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා ආධාර කිරීම සහ සහාය වීම;

(ආ) කොමිෂන් සභාවේ වැඩකටයුතුවල දෛනික කළමනාකරණය සහ පරිපාලනය සිදු කිරීම;

(ඇ) කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැකි හෝ අභිනියෝජනය කරනු ලැබිය හැකි පරිදි, මානව සම්පත් හා අදාළ සේවා කළමනාකරණය කිරීම;

(ඈ) කොමිෂන් සභාව විමසා එහි වාර්ෂික අයවැය සකස් කිරීම සහ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා ඒ අයවැය, ජනාධිපතිවරයාගේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීම;

(ඉ) අවශ්‍ය විය හැකි පරිදි, ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක්, අවසර පත්‍රයක්, සහතික පත්‍රයක් සහ වෙනත් යම් අනුමතයක් නිකුත් කිරීම හෝ ප්‍රදානය කිරීම ද ඇතුළුව, කොමිෂන් සභාව විසින් සපයනු ලබන සේවාවන් සහ පහසුකම් සඳහා පැනවිය යුතු ගාස්තු සහ වෙනත් අයකිරීම් කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(ඊ) මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද හෝ ප්‍රදානය කරන ලද යම් ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක්, අවසර පත්‍රයක්, සහතික පත්‍රයක් සහ වෙනත් යම් අනුමතයක් අලුත් කිරීම, තාවකාලිකව අත්හිටුවීම, ඉවත් කිරීම, අවලංගු කිරීම හෝ අවසන් කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(ඵ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී අවශ්‍ය විය හැකි පරිදි, ක්‍රියාවක් සිදු කිරීම; සහ

(ඵඅ) කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැකි හෝ අභිනියෝජනය කරනු ලැබිය හැකි ආකාරයේ වෙනත් යම් කර්තව්‍ය ඉටු කිරීම.

## VI වන කොටස

### බලයලත් තැනැත්තකු වීම සඳහා ඉල්ලුම් කිරීම සහ බලයලත් තැනැත්තකු ලෙස අනුමතය දීම, අත්සන් කරනු ලැබිය යුතු ගිවිසුම, ඒකීය අවස්ථා ආයෝජන පහසුකම, ව්‍යාපාරවල, සේවා නියුක්තිවල හෝ දේපළ මිල දී ගැනීම්, බද්දට ලබාදීම් හෝ කුලියට දීම්වල නිරතව සිටින හෝ පහසුකම් හෝ සේවාවන් උපයෝජනය කරන ශ්‍රී ලාංකික පුරවැසියන්

බලයලත් තැනැත්තන්ට, කොළඹ වරාය නගර බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසර දිය යුතු බව

**26.** (1) මේ පනත ප්‍රකාරව, බලයලත් තැනැත්තකුට හැර වෙනත් කිසිදු තැනැත්තකුට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසර ලබා නොදිය යුතු ය.

(2) යම් තැනැත්තකු, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අදහස් කරන අවස්ථාවක දී, ඒ යම් ඉල්ලුම්කරුවකුට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා බලයලත් තැනැත්තකු ලෙස සුදුසුකම් ලැබීම සහ අවසර දෙනු ලැබීම පිණිස, මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් අවශ්‍ය විය යුතු ය.

(3) සමාගමක්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අදහස් කරන අවස්ථාවක දී, ඒ යම් ඉල්ලුම්කරුවකුට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා බලයලත් තැනැත්තකු ලෙස සුදුසුකම් ලැබීම සහ අවසර දෙනු ලැබීම පිණිස -

(අ) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක්; සහ

(ආ) මේ පනතේ VII වන කොටස යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක්,

අවශ්‍ය විය යුතු ය.

(4) සමාගමක්, අක්වෙරළ බැංකු ව්‍යාපාරයක නිරත වීමට අදහස් කරන අවස්ථාවක දී, ඒ යම් ඉල්ලුම්කරුවකුට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාරයේ නිරත වීම සඳහා බලයලත් තැනැත්තකු ලෙස සුදුසුකම් ලැබීම සහ අවසර ලබා දෙනු ලැබීම පිණිස-

(අ) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක්;

(ආ) මේ පනතේ VII වන කොටස යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක්; සහ

(ඇ) මේ පනතේ VIII වන කොටස යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක්,

අවශ්‍ය විය යුතු ය.

කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවශ්‍ය විය හැකි ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය සඳහා වන ඉල්ලීම

**27.** (1) මේ පනත ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා, අවශ්‍ය විය හැකි ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් සඳහා වන ඉල්ලීමක් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සහ ආකාරයට සහ ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් යම් අනුමතයක් ලබා ගැනීම සම්බන්ධයෙන් නියම කරනු ලැබිය යුතු ගාස්තුව ද ගෙවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඒ සෑම ඉල්ලීමක් ම, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයේ තොරතුරු, ලේඛන සහ ආපසු ගෙවනු නොලබන පිරිසැකසුම් ගාස්තුවක් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඒ සෑම ඉල්ලීමක ම ශ්‍රී ලංකා රුපියල්වලින් හැර යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් කරනු ලැබිය යුතු යෝජිත සෘජු විදේශ ආයෝජනයේ සමස්ත වටිනාකම නිශ්චිතව දැක්විය යුතු අතර, එය මේ පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව සහ බලයලත් තැනැත්තා විසින් අත්සන් කිරීමට නියමිත අදාළ ගිවිසුමේ ද දක්වනු ලැබිය යුතු ය.

(4) බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන ගිණුමක ඇති කිසිදු විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවක් සහ ඒ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකින් ගනු ලැබූ විදේශ ව්‍යවහාර ණය මුදලක් හරහා රැස් කර ගන්නා ලද කිසිදු විදේශ ව්‍යවහාර මුදලක්, ඒ ආයෝජනයේ කාර්යය සඳහා බලයලත් තැනැත්තකු විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ යොදා ගනු නොලැබිය යුතු ය. එපරිද්දෙන්, මේ පනතේ මේ වගන්තියේ (5) වන උපවගන්තියේ සහ 39 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා කරනු ලබන සියලුම ආයෝජන ජාතික ආර්ථිකයේ යහපත පිණිස ශ්‍රී ලංකාවෙන් පිටතින් සම්පාදනය කරනු ලැබිය යුතු ය.

(5) 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ නිශ්චිතව දක්වා ඇති සීමා කිරීම් අදාළ නොවන යම් තැනැත්තකු හෝ සමාගමක් සහ මේ පනතේ 38 වන වගන්තිය හෝ 39 වන වගන්තිය ප්‍රකාරව අවසර දී ඇති පරිදි ඉඩම් බදු දී ඇති තැනැත්තකු හෝ සමාගමක් විසින්, එසේ බදු දී ඇති ඉඩමේ වටිනාකම මඟින් ඒ ආයෝජනයේ කොටසක් සාදනු ලැබීමේ පදනම මත, ශ්‍රී ලංකා රුපියල්වලින් හැර යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාරයක නිරත වීම සඳහා ආයෝජකයකු හෝ ආයෝජකයන් සමූහයක් සමඟ එක්ව අයදුම් කළ හැකිය. නියම කරනු ලැබිය හැකි වෙනත් කොන්දේසිවලට යටත්ව, ඒ ආයෝජනය මත වන ලාභාංශය හෝ වෙනත් යම් මූල්‍ය ප්‍රතිලාභයක් ශ්‍රී ලංකා රුපියල්වලින් හැර නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් සිදු කරනු ලැබිය යුතු ය යන පදනම මත කොමිෂන් සභාව විසින් ඒ අනුමතය ප්‍රදානය කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, මේ පනතේ 39 වන වගන්තිය යටතේ අදාළ බදුදීම වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලයක් තුළ ඒ තැනැත්තාට හෝ සමාගමට ලාභාංශයක් හෝ වෙනත් යම් මූල්‍ය ප්‍රතිලාභයක් උපචිත වන අවස්ථාවක, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ශ්‍රී ලංකාවේ, 39 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රුපියල්වලින් ඒ බදු දීම වෙනුවෙන් ගෙවීම කරනු ලැබූ තැනැත්තාගේ හෝ සමාගමේ නමින් ක්‍රියාත්මක කොට පවත්වාගෙන යනු ලබන නේවාසික විදේශ

ව්‍යවහාර මුදල් ගිණුමකට ඒ ලාභාංශය හෝ වෙනත් යම් මූල්‍ය ප්‍රතිලාභය ප්‍රේෂණය කිරීමට ඒ තැනැත්තා වෙත නියම කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව විසින් වැඩිදුර තොරතුරු ඉල්ලා සිටිය හැකි බව

**28.** (1) කොමිෂන් සභාව විසින්, 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වැඩිදුර තොරතුරු සහ ලේඛන ඉල්ලා සිටිය හැකි අතර, ඉල්ලුම්කරු විසින් ඒ තොරතුරු සහ ලේඛන, කොමිෂන් සභාව නිශ්චය කර ඉල්ලුම්කරු වෙත සන්නිවේදනය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ප්‍රකාරව, කොමිෂන් සභාව විසින්, නිකුත් කරනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන සෑම ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් අනුමතයක්-

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියකින් විය යුතු ය;

(ආ) වෙනත් කරුණු අතර, ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබා දීම හෝ වෙනත් අනුමතය ප්‍රදානය කරනු ලබන ව්‍යාපාරයේ වර්ගය පිළිබඳව සැලකිල්ල යොමු කරමින් කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක ගාස්තුව ගෙවීම මත ප්‍රදානය කරනු ලැබිය යුතු ය;

(ඇ) ඒ ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබා දීම හෝ වෙනත් අනුමතය සඳහා යම් වලංගු කාලසීමාවක් ඇත්නම්, ඒ වලංගු කාලසීමාව එහි නිශ්චිතව දැක්විය යුතු ය;

(ඈ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට බලයලත් තැනැත්තකු විසින් නිරත වීමට අපේක්ෂිත ව්‍යාපාරය නිශ්චිතව දැක්විය යුතු ය; සහ

(ඉ) ඒ ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබා දීම හෝ වෙනත් අනුමතය ලබාදීම සම්බන්ධ යම් කොන්දේසි වේ නම්, ඒවා නිශ්චිතව දැක්විය යුතු ය.

(3) (අ) ඉල්ලුම්කරුවකු බලයලත් තැනැත්තකු ලෙස අනුමත කිරීම;

(ආ) බලයලත් තැනැත්තකුගේ ඉල්ලීම මත ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් සංශෝධනය කිරීම, ආපසු භාර දීම, මාරු කිරීම, පැවරීම හෝ අලුත් කිරීම; සහ

(ඇ) යම් බලයලත් තැනැත්තකු විසින් සැලකිය යුතු පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් කළ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ බලයලත් තැනැත්තාට ඒ සඳහා හේතු ලිඛිතව දැනුම් දීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් අනුමතයක්, සාධාරණ හේතුවක් මත තාවකාලිකව අත්හිටුවීම, අහෝසි කිරීම හෝ අවලංගු කිරීම,

පිළිබඳ කාර්ය පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) සියලුම බලයලත් තැනැත්තන්ගේ විස්තර සහ ඒ එක් එක් තැනැත්තාට නිකුත් කරන ලද හෝ ප්‍රදානය කරන ලද ලියාපදිංචියේ, බලපත්‍රයේ, බලය ලබා දීමේ හෝ වෙනත් අනුමතයේ වර්ගය ඇතුළත් විය යුතු රෙජිස්ටරයක් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියෙන් සහ ආකාරයෙන් කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

ඉල්ලුම්පත්‍රයේ සාවද්‍ය තොරතුරු ඇතුළත් කරනු නොලැබිය යුතු බව

**29.** කවර හෝ ඉල්ලුම්කරුවකු විසින්-

(අ) මේ පනතේ මේ කොටස ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන්; හෝ

(ආ) මේ පනත ප්‍රකාරව ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු යයි නියමිත යම් තොරතුරු හෝ විස්තර සම්බන්ධයෙන්,

වූ යම් වැදගත් කරුණක් පිළිබඳව සාවද්‍ය යයි හෝ නොමඟ යවන සුලු යයි තමා දන්නා යම් නියෝජනයක් හෝ ප්‍රකාශයක් කරනු නොලැබිය යුතු ය. මේ වගන්තියේ විධිවිධාන කඩ කරනු ලබන යම් තැනැත්තකු මේ පනත ප්‍රකාරව වරදක් සිදු කරන්නේ ය.

මේ පනත ප්‍රකාරව ප්‍රදානය කරනු ලබන යම් ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව, ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නකු ලෙස කටයුතු කළ යුතු බව

**30.** (1) මේ පනතේ VII වන කොටසට, VIII වන කොටසට සහ 33 වන වගන්තියට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ව්‍යාපාර කටයුතුවල නිරත වීමට, ආයෝජනය කිරීමට, පදිංචි වීමට, සේවානියුක්ත වීමට හෝ ඊට පැමිණීමට ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් සඳහා කොමිෂන් සභාව වෙත කරනු ලබන යම් ඉල්ලීමක් පිළිගන්නේ ද නැතහොත් සාධාරණ හේතුවක් මත ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න කඩිනමින් සහ සම්බන්ධිත ආකාරයෙන් සලකා බලා තීරණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නා කොමිෂන් සභාව විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නාගේ තත්ත්වයෙන්, මේ පනතේ 27 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ලැබුණු යම් ඉල්ලීමක් පිළිගන්නේ ද නැතහොත් ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න නිශ්චය කරනු ලැබිය යුතු ය. යම් ඉල්ලීමක් පිළිගත හැකි බව පෙනී යන්නේ නම්, කොමිෂන් සභාව විසින් ඒ ඉල්ලුම්කරුට සිය තීරණය ලිඛිතව දැනුම් දිය යුතු ය. ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් සිය තීරණයට හේතු ද සමඟ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඒ ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(3) කොමිෂන් සභාව විසින් ඒ ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය ලබා දීමේ ක්‍රියාවලියේ දී, අදාළ නියාමන අධිකාරියට අදාළ වන ලිඛිත නීති මඟින් ඒ අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය ලබා ගත යුතු යයි නියම කරන අවස්ථාවක දී, ඒ අධිකාරිය සතු හෝ ඒ අධිකාරිය වෙත පවරනු ලැබ ඇති විෂයයන් සම්බන්ධයෙන් සහ මේ පනතේ විශේෂයෙන් විධිවිධාන සලසා ඇති ප්‍රමාණය තෙක්, ඒ අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය ලබා ගත යුතු ය:

එසේ වුව ද, ඉල්ලා සිටිනු ලබන අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය, ඒ එක් එක් අධිකාරියට අදාළ වන ලිඛිත නීති කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය ඇතුළත ක්‍රියාත්මක කිරීමට සීමා විය යුතු ය:

එසේම තවදුරටත්, කොමිෂන් සභාව විසින් ඒ එකඟත්වය ඉල්ලා සිටිනු ලබන්නේ යම් නියාමන අධිකාරියකින් ද, ඒ අදාළ නියාමන අධිකාරිය විසින්, අවස්ථානුගත කරුණු අනුව, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින්, ප්‍රමුඛත්වය ලබා දිය යුතු කරුණක් ලෙස සලකා ඒ එකඟත්වය කොමිෂන් සභාව වෙත ලබා දෙනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවට යොමු කරන ලද ඉල්ලීම් පිරිසැකසීම සහ ඒ එකඟත්වය ලබාදීම කඩිනමින් සිදු වන බවට සහතික කිරීමේ කාර්යය සඳහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ කාර්යාලයක් ක්‍රියාත්මක කරන ලෙස කොමිෂන් සභාව විසින් යම් අදාළ නියාමන අධිකාරියක් වෙත නියම කළ යුතු ය. ඒ ඉල්ලීම් කඩිනමින් පිරිසැකසීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨත්වයක් සහ අධිකාරී බලයක් ඇති නිලධරයන් විසින් ඒ කාර්යාලය කළමනාකරණය කරනු ලබන බවට අදාළ නියාමන අධිකාරිය සහතික විය යුතු ය.

කොමිෂන් සභාව විසින් බලයලත් තැනැත්තකු ලෙස කටයුතු කිරීම සඳහා ලියාපදිංචි කිරීම්, බලපත්‍ර, බලය ලබාදීම් හෝ වෙනත් අනුමතයන් ප්‍රදානය කිරීම කළ යුතු බව

**31.** (1) කොමිෂන් සභාව විසින් මේ පනතේ 27 වන වගන්තිය ප්‍රකාරව ලැබුණු යම් ඉල්ලීමක් ඇගයීමෙන් පසුව, ඒ ඉල්ලීම ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස පිළිගනු ලැබිය යුතු යයි සලකනු ලබන අවස්ථාවක දී, ඉල්ලා ඇති ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය නිකුත් කිරීම හෝ ප්‍රදානය කිරීම සඳහා කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) එසේ නිකුත් කරන ලද හෝ ප්‍රදානය කරන ලද ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් නියම හෝ කොන්දේසිවලට යටත් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් එසේ නිකුත් කරන ලද හෝ ප්‍රදානය කරන ලද අවස්ථාවක දී, ඒ යම් ලේඛනයක පටහැනිව යම් කොන්දේසියක් නිශ්චිතව දක්වා ඇත්නම් මිස, අදාළ එක් එක් නියාමන අධිකාරියට අදාළ වන ලිඛිත නීති මගින් ඒ අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය ලබා ගත යුතු යයි නියම කරන අවස්ථාවක දී, අදාළ නියාමන අධිකාරියේ නිසි එකඟත්වය ලබා ගැනීමෙන් පසුව, අදාළ ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය සම්බන්ධයෙන් වූ සියලු නීතිමය සහ නියාමන අවශ්‍යතා නිසි ලෙස අනුගමනය කොට ඇති බව තහවුරු කර සෑහීමට පත් වීම, කොමිෂන් සභාවේ වගකීම විය යුතු ය.

කොමිෂන් සභාව විසින් සෑම බලයලත් තැනැත්තකු සමඟ ම ගිවිසුමකට එළැඹිය යුතු බව

**32.** කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිදු කිරීමට නියමිත ආයෝජනයට අදාළව, වෙනත් කරුණු අතර, යම් නියම, කොන්දේසි, අදාළ සීමා කිරීම්, (39 වන වගන්තිය ප්‍රකාරව ගෙවනු ලැබූ යම් මුදලක් ද ඇතුළුව) සිදු කිරීමට සැලසුම් කරඇති සෘජු විදේශ ආයෝජනයේ මුළු වටිනාකම සහ යම් සහන හෝ නිදහස් කිරීම් සහ මේ පනත යටතේ ඒවා ප්‍රදානය කරනු ලබන කාලසීමාව

දක්වමින්, කොමිෂන් සභාව විසින් සෑම බලයලත් තැනැත්තකු සමඟ ම ගිවිසුමකට ඇතුළත් වනු ලැබිය යුතු ය. ඒ සෑම ගිවිසුමක ම, එයින් උද්ගත වන යම් ආරවුලක් මේ පනතේ XIII වන කොටස ප්‍රකාරව බේරුම් කිරීම මඟින් නිරවුල් කර ගැනීමට පාර්ශ්වයන් එකඟ වන්නා වූ විධිවිධානයක් අඩංගු විය යුතු ය. 27 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි කරන ලද යම් හිමිකාරත්ව දායක මුදලක් ද එහි වෙනම නිරූපණය කරනු ලැබිය යුතු ය.

වෙනත් සියලු අවසරපත්‍ර ආදිය සඳහා කොමිෂන් සභාව ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නා විය යුතු බව

**33.** (1) කොමිෂන් සභාව, ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නා වශයෙන්, බලයලත් තැනැත්තකුට, බලයලත් තැනැත්තකුගේ යම් උපදේශකයකුට හෝ බලයලත් තැනැත්තකු විසින් විශේෂයෙන් බලය ලබාදෙන ලද යම් තැනැත්තකුට හෝ බලයලත් තැනැත්තකුගේ සේවා නියුක්තයකුට, සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ව්‍යාපාරවල නිරත වීමට, ආයෝජනය කිරීමට, පදිංචි වීමට, සේවයේ නියුක්ත වීමට හෝ ඊට පැමිණීමට අදහස් කරන තැනැත්තකුට අවශ්‍ය විය හැකි වීසා බලපත්‍රයක්, ඇතුළුවීමේ අවසර පත්‍රයක් හෝ වැඩ කිරීමේ අවසර පත්‍රයක් සහ වෙනත් අනුමතයන් සඳහා වන ඉල්ලීමක් භාරගැනීම සහ ඒවා පිරිසැකසීම සඳහා පහසුකම් සැලසීම අවශ්‍ය විය හැකි පරිදි කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ යම් ඉල්ලීමක් ඇගැයීමෙන් පසුව, ඒ ඉල්ලීම ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස භාරගත යුතු යයි සලකනු ලබන අවස්ථාවක, ඒ කරුණ ආගමන සහ විගමන පාලකවරයාට දැනුම් දෙනු ලැබිය හැකි අතර, ඒ වීසා බලපත්‍රය, ඇතුළුවීමේ අවසර පත්‍රය හෝ වැඩ කිරීමේ අවසරපත්‍රය හෝ වෙනත් අනුමතය ප්‍රමුඛතා පදනමක් මත ප්‍රදානය කිරීමට නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, ආගමන සහ විගමන පාලකවරයාගේ තීරණය පදනම් කොට ගනිමින්, ඒ ඉල්ලීම ආගමන සහ විගමන පාලකවරයා විසින් පිළිගනු ලබන්නේ නම් ඒ බව ඒ ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, ඒ වීසා බලපත්‍රය, ඇතුළුවීමේ අවසර පත්‍රය හෝ වැඩ කිරීමේ අවසර පත්‍රය හෝ වෙනත් අනුමතය නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසිය යුතු අතර, ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඒ බව, ආගමන සහ විගමන පාලකවරයා විසින් දැනුම් දී ඇති පරිදි ඒ සඳහා වන හේතු ද සමඟ ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

ආගමන සහ විගමන පාලකවරයාගේ ඒ තීරණය අවසානාත්මක වන්නේ ය.

*යම් ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් හෝ යම් වීසා බලපත්‍රයක්, ඇතුළුවීමේ හෝ වැඩ කිරීමේ අවසර පත්‍රයක් හෝ වෙනත් අනුමතයක් ප්‍රදානය කිරීමෙන් හෝ නිකුත් කිරීමෙන් පසුව අත්හිටුවීම, ඉවත් කිරීම හෝ අවලංගු කිරීමේ කාර්ය පටිපාටිය*

**34.** කොමිෂන් සභාව විසින්-

(අ) 31 වන වගන්තිය ප්‍රකාරව යම් ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් අනුමතයක්; හෝ

(ආ) 33 වන වගන්තියේ දක්වා ඇති පරිදි, යම් වීසා බලපත්‍රයක්, ඇතුළුවීමේ අවසර පත්‍රයක් හෝ වැඩ කිරීමේ අවසර පත්‍රයක් හෝ වෙනත් අනුමතයක්,

සම්බන්ධයෙන් පහසුකම් සැලසීමෙන් සහ නිකුත් කිරීමෙන් හෝ ප්‍රදානය කිරීමෙන් අනතුරුව, ආගමන සහ විගමන පාලකවරයා විසින් අවශ්‍ය යයි සලකන පරිදි ඒවා තාවකාලිකව අත්හිටුවීමට, ඉවත් කිරීමට හෝ අවලංගු කිරීමට ආගමන සහ විගමන පාලකවරයා වෙත නිර්දේශ කිරීමට කොමිෂන් සභාවට සිදුවන හේතුවක් දැන ගැනීමට ලැබුණු අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, ඒ පිළිබඳව ආගමන සහ විගමන පාලකවරයාට සහ බලයලත් තැනැත්තාට දැනුම් දිය යුතු ය. එවිට ආගමන සහ විගමන පාලකවරයා විසින්, අවස්ථාවොචිත පරිදි, ඒ ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය තාවකාලිකව අත්හිටුවීමට, ඉවත් කිරීමට හෝ අවලංගු කිරීමට කටයුතු කළ යුතු ය. ආගමන සහ විගමන පාලකවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබා දීම හෝ වෙනත් අනුමතය තාවකාලිකව අත්හිටුවීමට, ඉවත් කිරීමට හෝ අවලංගු කිරීමට කටයුතු කිරීමෙන් පසුව ඒ පිළිබඳව කොමිෂන් සභාවට දැනුම් දිය යුතු අතර, කොමිෂන් සභාව විසින් ඉන් ඉක්බිතිව ම අදාළ බලයලත් තැනැත්තා වෙත ඒ පිළිබඳව දැනුම් දිය යුතු ය. ආගමන සහ විගමන පාලකවරයාගේ ඒ තීරණය අවසානාත්මක වන්නේ ය.

*වාසිකයකු හෝ නිර්වාසිකයකු සේවයේ යෙදවීමට බලයලත් තැනැත්තකුට අවසර ඇති බව*

**35.** කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසර ලැබී ඇති බලයලත් තැනැත්තකු විසින් වාසික හෝ නිර්වාසික යම් තැනැත්තකු සේවයේ නියුක්ත කළ හැකි අතර, ඒ සේවානියුක්තයාට ශ්‍රී ලංකා රුපියල් නොවන නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය. තව ද -

(අ) එසේ ලැබුණු වාසික සේවා නියුක්තයකුගේ සේවානියුක්ති ආදායම, ආදායම් බද්දෙන් නිදහස් විය යුතු අතර, ඒ මුදල් ඒ වාසික සේවානියුක්තයාගේ පෞද්ගලික විදේශ

ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කිරීමට අවසර ඇති සේ සලකනු ලැබිය යුතු ය;

(ආ) එසේ ලැබුණු නිර්වාසික සේවා නියුක්තයකුගේ සේවා නියුක්ති ආදායම, ආදායම් බද්දෙන් නිදහස් විය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ඒ නිර්වාසික සේවානියුක්තයා ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයා ගත් යම් ආදායමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දී ආදායම් බද්දට යටත් නොවිය යුතු ය.

බලයලත් තැනැත්තකු විසින්, නියම කරනු ලැබිය හැකි පරිදි ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකුවක ශ්‍රී ලංකා රුපියල් ගිණුමක් පවත්වාගෙන යා හැකි බව

**36.** කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වන යම් බලයලත් තැනැත්තකු විසින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ දී ශ්‍රී ලංකාවේ පුරවැසියකුට හෝ වාසිකයකුට ඒ බලයලත් තැනැත්තා සපයනු ලබන යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් ලබා ගත හැකි ය. ඒ බලයලත් තැනැත්තා විසින් එසේ ලබා ගන්නා ශ්‍රී ලංකා රුපියල් නියම කරනු ලැබිය යුතු ආකාරයට සහ නියම කරනු ලැබිය යුතු යම් කොන්දේසිවලට යටත්ව, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කරනු ලැබිය හැකි ය.

බලයලත් තැනැත්තකු විසින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු කරන ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ ශ්‍රී ලංකාවේ වාසිකයකු සමඟ ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා ඉල්ලුම් කළ හැකි බව

**37.** (1) බලයලත් තැනැත්තකු විසින්, තත් කාලයේ බලපවත්නා සියලු ලිඛිත නීති සහ මේ පනත යටතේ සාදනු ලැබිය හැකි නියෝග අදාළ වීමට යටත්ව, ජාතික යහපත පිණිස සහ දේශීය ආර්ථිකයේ යහපත ආරක්ෂා කිරීම පිණිස ශ්‍රී ලංකාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාර කටයුතුවල නිරත ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ ශ්‍රී ලංකාවේ වාසිකයකු සමඟ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා ඉල්ලීමක් කොමිෂන් සභාව වෙත කළ හැකි ය.

(2) ඒ ඉල්ලීම සලකා බැලීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස, සහ දේශීය ආර්ථිකයේ යහපත සහතික කරමින්, නියම කරනු ලැබිය යුතු ආකාරයට සහ නියම කරනු ලැබිය යුතු යම් කොන්දේසිවලට යටත්ව ඒ සඳහා බලය ලබා දීම සිදු කළ හැකි ය.

(ශ්‍රී ලංකා රුපියල් නොවන) නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට, අලෙවි කළ හැකි ඉඩම් බද්දට දීම හෝ සහාධිපත්‍ය කොටස් නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම, බද්දට දීම හෝ කුලියට දීම

**38.** කොමිෂන් සභාව විසින්, මේ පනතේ විධිවිධානවලට, 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ විධිවිධානවලට සහ වෙනත් අදාළ ලිඛිත නීතිවලට යටත්ව, යම් තැනැත්තකුට -

(අ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද, මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද රජයේ අලෙවි කළ හැකි ඉඩම් බද්දට දීම;

(ආ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද, මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද, ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම්, ඒ ඉඩම්වලට අදාළ ඒවායේ ප්‍රධාන බද්ද දරන්නා වූ ව්‍යාපෘති සමාගම සමඟ හවුලේ බද්දට දීම;

(ඇ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද, මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද, රජයේ අලෙවි කළ හැකි ඉඩම් මත පිහිටා ඇති සහාධිපත්‍ය කොටස්, අවස්ථාවෝචිත පරිදි, අදාළ ආයෝජකයා හෝ සංවර්ධකයා සමඟ ඒකාබද්ධව බදු දීම හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම;

(ඈ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද, මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද, ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් මත පිහිටා ඇති සහාධිපත්‍ය කොටස් ඒ ඉඩම්වල ප්‍රධාන බදු දරන්නා වූ ව්‍යාපෘති සමාගම සමඟ ඒකාබද්ධව බදු දීම හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම,

සිදු කළ හැකි අතර, ඒ සඳහා වන ගෙවීම ශ්‍රී ලංකා රුපියල් නොවන යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ගෙවනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා රුපියල්වලින් වුවද, අලෙවි කළ හැකි ඉඩම් බද්දට දීම හෝ පරිශ්‍රයන් හෝ සහාධිපත්‍ය කොටස් නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම, බද්දට දීම හෝ කුලියට දීම

**39.** 38 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, කොමිෂන් සභාව විසින්, 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ නිශ්චිතව දක්වා ඇති සීමාවන් අදාළ නොවන යම් තැනැත්තකුට හෝ සමාගමකට රජයේ අලෙවි කළ හැකි ඉඩම් හෝ ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් බද්දට දීම හෝ රජයේ අලෙවි කළ හැකි ඉඩම් මත හෝ ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් මත පිහිටා ඇති යම් සහාධිපත්‍ය කොටස් බද්දට දීම හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට අනුව, ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ දක්වා ඇති සීමාවන් අදාළ නොවන්නා වූ ද, ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් සිදුකර ඇත්තා වූ ද, ඒ තැනැත්තා හෝ සමාගම විසින්, ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම කරනු ලැබ ඇති ඒ ගනුදෙනුව සිදු කිරීමේ දින සිට අවුරුදු පහක කාලයක් ඇතුළත ආපසු ඒ දේපළ, ශ්‍රී ලංකා රුපියල් නොවන වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් සිදු කරනු ලබන ගෙවීමක් මත තුන්වන පාර්ශ්වයට පවරන්නේ නම්, බද්දට දෙනු ලබන්නේ නම් හෝ කුලියට දෙනු ලබන්නේ නම්, ශ්‍රී ලංකා රුපියල් නොවන යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එසේ ලැබුණු මුදල් ප්‍රමාණය ඉහත කී තැනැත්තාගේ හෝ සමාගමේ නමින්, ශ්‍රී ලංකාව තුළ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ක්‍රියාත්මක කරන සහ පවත්වා ගෙන යන යම් නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට, නියම කරනු ලබන ආකාරයකට ප්‍රේෂණය කරනු ලැබීමට නියම කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇති පහසුකම් හෝ සේවාවන් භාවිත කළ හැකි බව

**40.** (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු විසින් අදාළ ගෙවීම් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීමෙන් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇති භෝජනාගාර, සිනමාහල්, විනෝදාත්මක පහසුකම්, සාප්පු සවාරි පහසුකම් හෝ වාහන ගාල් කිරීමේ පහසුකම් වැනි යම් සිල්ලර වෙළඳ පහසුකම් හෝ සේවාවන් භාවිත කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි සිල්ලර වෙළඳ පහසුකමකින් මිල දී ගනු ලබන භාණ්ඩ මත කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිට වී යන විට ගෙවීමට නියම කරනු ලැබිය හැකි යම් අයබදු, නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි යම් සිල්ලර වෙළඳ පහසුකම් හෝ සේවාවන් භාවිත කිරීමේ දී යම් බලයලත් තැනැත්තකුට ලැබෙන මුදල්

ප්‍රමාණයන්, නියම කරනු ලබන ආකාරයට සහ නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව, ඒ බලයලත් තැනැත්තා විසින්, නම් කරන ලද යම් විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කරනු ලැබිය හැකි ය.

## VII වන කොටස

## කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන අක්වෙරළ සමාගම්

**41.** (1) 2007 අංක 7 දරන සමාගම් පනතේ XI වන කොටසේ විධිවිධාන නොතකා, මේ පනතේ මේ කොටසේ විධිවිධාන කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම පිණිස සංස්ථාගත කරන ලද අක්වෙරළ සමාගම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මේ පනතේ කාර්ය සඳහා සමාගම්, අක්වෙරළ සමාගම් ලෙස ලියාපදිංචි කිරීම

(2) මේ පනතේ මේ කොටස යටතේ අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කරනු ලැබීම පිණිස සමාගමකින් ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, කොමිෂන් සභාව විසින්, ඒ ඉල්ලුම්පත්‍රය කොමිෂන් සභාවට පිළිගත හැකි නම්, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස, ඒ සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ XI වන කොටස ප්‍රකාරව අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙස සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසරය ඇති අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ ඉල්ලුම්කාර සමාගමට නිකුත් කරන ලෙස සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(3) අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කරනු ලැබීම පිණිස කොමිෂන් සභාව වෙත යොමු කරන ඉල්ලුම්පත්‍රයක් පහත දෑ සමඟ එවනු ලැබිය යුතු ය:-

(අ) සමාගම සංස්ථාපිත කරන හෝ සංස්ථාපිත කිරීම අර්ථ නිරූපනය කරන අධිකාරපත්‍රයේ, ව්‍යවස්ථාවේ හෝ සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ වෙනත් යම් සාධනපත්‍රයක සහතික කරන ලද පිටපතක්, සහ ඒ සාධනපත්‍රය රාජ්‍ය භාෂාවකින් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නොවන අවස්ථාවක, ඒ සාධනපත්‍රයේ ඉංග්‍රීසි පරිවර්තනයක්;

(ආ) සමාගමේ අධ්‍යක්ෂවරු හෝ එහි කටයුතු කළමනාකරණය කරන තැනැත්තන්ගේ සම්පූර්ණ නම්, ලිපින, රැකියා සහ ඔවුන් සමාගමේ දරන තනතුරු ඇතුළත් ලැයිස්තුවක්;

(ඇ) විදේශයක සංස්ථාගත කරන ලද සමාගමක් සම්බන්ධයෙන් වන විට දී, සමාගම නියෝජනය කිරීමට බලයලත් තැනැත්තන් වන ශ්‍රී ලංකාවේ වාසික සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන, එක් අයෙකු හෝ වැඩි ගණනකගේ නම් සහ ලිපින;

(ඈ) විදේශයක සංස්ථාගත කරන ලද සමාගමක් සම්බන්ධයෙන් වන විට දී -

(i) සංස්ථාගත කළ රටේ සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ හෝ ප්‍රධාන කාර්යාලයේ සම්පූර්ණ ලිපිනය සහ සමාගමේ ශ්‍රී ලංකාවේ කාර්යාලයේ සම්පූර්ණ ලිපිනය අඩංගු ප්‍රකාශයක්; සහ

(ii) ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමට දින තිහකට පෙරාතුව, නිකුත් කරනු ලබන අධිකාරිය විසින් සහතික කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකයේ පිටපතක්;

(ඉ) ඒ සමාගමට අක්වෙරළ සමාගමක් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ලියාපදිංචි වීමට ඒ සමාගම සංස්ථාගත කළ රටේ කිසිදු නීතිමය බාධාවක් නොමැති බවට ඒ සමාගම විසින් නිසි පරිදි සත්‍යායනය කොට නිකුත් කරන ලද ප්‍රකාශයක්; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන, ආපසු ගෙවනු නොලබන, ඉල්ලුම්පත්‍රය පිරිසැකසුම් කිරීමේ ගාස්තුව.

(4) ඉල්ලුම්කරු විසින්, එසේ ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති තොරතුරුවල යම් වෙනසක් හෝ සුළු වෙනසක් සිදු වූ අවස්ථාවක, වහාම ඒ වෙනස හෝ සුළු වෙනස සම්බන්ධයෙන් කොමිෂන් සභාවට දැනුම් දිය යුතු අතර, කොමිෂන් සභාව විසින්, අවශ්‍ය විය හැකි පරිදි ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර ගැනීම සඳහා ඒ පිළිබඳව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ මේ කොටස ප්‍රකාරව, අක්වෙරළ සමාගමක් ලෙස ක්‍රියාත්මක වීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුවකුගේ නමින් නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබුවේ යම් සමාගමක් වෙත ද, ඒ සමාගම සමාගම් පනතේ විධිවිධාන සමඟ අනුකූලව කටයුතු කිරීමෙන් නිදහස් කිරීමක් ලෙසට සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධාන ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ සමාගමක් ලෙස ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසර ලබා දෙමින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කොට ඇත්තේ යම් සමාගමකට ද, ඒ සමාගම 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා නිර්වාසික සමාගමක් ලෙස සලකනු ලැබිය යුතුය.

(7) මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලා ඇති සමාගම, ඒ සමාගම සංස්ථාගත කරන ලද රට තුළ නියාමනය කරනු ලබන්නේ ය යන පදනම මත, මෙහි දී සංස්ථාගත කරන ලද අක්වෙරළ සමාගම්වලට අදාළ විය යුතු පරිදි, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා යම් නියෝග සාදනු ලැබිය හැකි ය.

(8) මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි කරන ලද අක්වෙරළ සමාගමක්, කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන පරිදි, මේ පනත ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට පමණක් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබිය හැකි ය.

(9) මේ පනත ප්‍රකාරව අක්වෙරළ සමාගමක් ලෙස ව්‍යාපාර කටයුතු ඉදිරියට කරගෙන යාමට අදහස් කරන අක්වෙරළ සමාගමක්, ඒ වර්ෂය ආරම්භයේ දී සහ පසුව එළඹෙන සෑම වර්ෂයක ම ජනවාරි මස තිස් එක් වන දිනයට පෙරාතුව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු මුදලක වාර්ෂික ගාස්තුවක් ගෙවීම පිළිබඳ සාක්ෂ්‍ය, නිශ්චිතව දක්වනු ලබන ආකාරයට, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(10) එසේ ලියාපදිංචි කරන ලද අක්වෙරළ සමාගමක්, කොමිෂන් සභාව වෙත ලිඛිතව දෙනු ලබන දැන්වීමක් මඟින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ සමාගමක් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර කිරීම පිළිබඳ සිය අදහස කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය හැකි ය. කොමිෂන් සභාව විසින්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ එකඟත්වය ඇතිව අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(11) කොමිෂන් සභාව විසින්, නිකුත් කරන ලද යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක්, යම් සාධාරණ හේතුවක් මත අවලංගු කරන මෙන්, ඒ සඳහා හේතු සඳහන් කරමින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට නිර්දේශ කළ හැකි අතර, එවිට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කරනු ලැබිය යුතු ය. එසේ අවලංගු කිරීමෙන් පසුව ඒ අක්වෙරළ සමාගම මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ආනුෂංගිකව ප්‍රදානය කරන ලද වරප්‍රසාද සහ ප්‍රතිලාභ භුක්ති විඳීම අවසන් කළ යුතු ය. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒ අවලංගු කිරීම සිදු කළ විට, කොමිෂන් සභාව විසින් ඒ සඳහා හේතු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම්කරුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

VIII වන කොටස

## කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට කරනු ලබන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු

කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා අවශ්‍ය බලපත්‍රය

**42.** (1) බැංකු පනතේ IV වන කොටසේ විධිවිධානවල කුමක් සඳහන්ව වුව ද, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම සම්බන්ධයෙන් මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) බැංකු පනත ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමට බලපත්‍රලාභී සමාගමක් හෝ වෙනත් යම් රටක නීතියක්, අධිකාරපත්‍රයක්, ව්‍යවස්ථාවක්, සාංගමික ව්‍යවස්ථාවලියක් හෝ සමාගම සංස්ථාපිත කරන හෝ ඒ සංස්ථාපිත කිරීම අර්ථ නිරූපනය කරන වෙනත් සාධනපත්‍රයක් යටතේ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රලාභී සමාගමක්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අදහස් කරන්නේ නම්, මේ පනත ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, ඒ ඉල්ලුම්පත්‍රය කොමිෂන් සභාවට පිළිගත හැකි නම්, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස, ජනාධිපතිවරයාගේ හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මේ පනතේ විෂය පථය තුළ දක්වා ඇති සීමාවන් තුළ පනවනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා බැංකු පනත යටතේ බලපත්‍රයක් ලබා දීමට කටයුතු කරන ලෙස මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතුය.

(4) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින්, මුදල් මණ්ඩලයේ එකඟත්වය ඇතිව, මේ පනතේ දක්වා ඇති නියමයන් සම්බන්ධයෙන් සෑහීමට පත් වීමෙන් අනතුරුව, බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

**මේ පනතේ මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම**

**43.** මේ පනතේ මේ කොටස ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට නිකුත් කරන ලද බලපත්‍රයක්, එසේ නිරත වන ඒ ව්‍යාපාර කටයුතු ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස නොවන බව හෝ කරගෙන යනු ලබන ඒ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල විචක්ෂණශීලී කළමනාකරණ ඌණතාවක් ඇති බව සහ දෘශ්‍යමාන අස්ථාවරත්වයක් ඇති බව පෙනී යන බව, බලපත්‍රලාභියාට ඔහුගේ නිදහසට කරුණු කියා සිටීමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව ඔප්පු වේ නම්, කොමිෂන් සභාව විසින්, මුදල් මණ්ඩලයේ එකඟත්වය ඇතිව ඒ බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීම, ඉවත් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

**ජනාධිපතිවරයා විසින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට කරන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් අදාළ වන නියෝග සෑදිය හැකි බව**

**44.** ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින්, මේ පනතේ විෂය පථය බලාත්මක කිරීම සඳහා සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමේ දී විචක්ෂණශීලී කළමනාකරණය සහ විශ්වසනීයත්වය පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා අවශ්‍ය විය හැකි නියෝග, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා සහ මුදල් මණ්ඩලය විමසා, කලින් කලට සාදනු ලැබිය හැකි ය.

**වෙනත් කාරණා අතර, දක්වා ඇති කාරණා සඳහා විධිවිධාන සැලැස්වීමට නියෝග සෑදිය හැකි බව**

**45.** මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, මුදල් මණ්ඩලයේ එකඟත්වය ඇතිව, අනෙකුත් කාරණා අතර, බලපත්‍ර ප්‍රදානය කිරීම, තාවකාලිකව අත්හිටුවීම සහ අවලංගු කිරීම, ප්‍රාග්ධන අවශ්‍යතා, සංචිත අරමුදල්, ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යාම, මූල්‍යමය සහ ක්‍රියාකාරී අවදානම් කළමනාකරණය, මේ පනතේ VII වන කොටස ප්‍රකාරව අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති සමාගමක ශ්‍රේණිගත කිරීම තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව, වැරදි ක්‍රියාවක් සාධාරණ ලෙස ඔප්පු කරන

ලද අවස්ථාවක හෝ කරගෙන යනු ලබන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල දෘශ්‍යමාන අස්ථාවරභාවයක් ඇති අවස්ථාවක අදාළ වන සීමා කිරීම් හා දණ්ඩන සහ අදාළ වෙනත් කාරණා පිළිබඳව විධිවිධාන සැලැස්වීමට නියෝග සාදනු ලැබිය හැකි ය.

අක්වෙරළ බැංකු ව්‍යාපාරවල නිරත අයට නිරත වීමට බලය දෙනු ලැබිය හැකි ව්‍යාපාරවල ස්වභාවය

**46.** කොමිෂන් සභාව විසින්, ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස, ජනාධිපතිවරයාගේ හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අක්වෙරළ බැංකු ව්‍යාපාරයේ නිරත යම් සමාගමකට පහත සඳහන් සියලු හෝ ඇතැම් ව්‍යාපාර කරගෙන යාමට බලය දෙන ලෙස මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබිය හැකි ය:-

(අ) යම් බලයලත් තැනැත්තකුගෙන් හෝ නිර්වාසික තැනැත්තකුගෙන් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඉතිරි කිරීමේ තැන්පතු, කාලීන තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු භාර ගැනීම;

(ආ) යම් නිර්වාසික තැනැත්තකුගෙන් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීම;

(ඇ) යම් නිර්වාසික තැනැත්තකුට යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් මූල්‍ය පහසුකමක් ලබා දීම;

(ඈ) යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වෙනත් යම් අක්වෙරළ ඒකකයක් සමඟ යම් ගනුදෙනුවක නිරත වීම;

(ඉ) යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් නිර්වාසික තැනැත්තකු සමඟ වෙනත් යම් ගනුදෙනුවක නිරත වීම;

(ඊ) මේ පනත යටතේ අදහස් කරන වෙනත් යම් ගනුදෙනුවක නිරත වීම;

(උ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ අවසර දී ඇති යම් ගනුදෙනුවක නිරත වීම; හෝ

(ඌ) මුදල් මණ්ඩලයේ එකඟත්වය ඇතිව යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන වෙනත් යම් ගනුදෙනුවක නිරත වීම.

*බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සෑම සමාගමක් විසින් ම මූල්‍ය ප්‍රකාශයක් දිය යුතු බව*

**47.** මේ පනතේ මේ කොටස ප්‍රකාරව අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමට බලපත්‍රයක් නිකුත් කොට ඇති සෑම සමාගමක් විසින් ම, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශයක් වාර්ෂිකව පිළියෙළ කරනු ලැබිය යුතුය.

*වාර්ෂික වාර්තාවක් පිළියෙළ කිරීම*

**48.** (1) මේ පනතේ මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සෑම අක්වෙරළ සමාගමක් විසින් ම, 47 වන වගන්තියේ සඳහන් සිය මූල්‍ය ප්‍රකාශය විගණනය කොට ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම සඳහා, වාර්ෂිකව ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනයක් පත් කරනු ලැබිය යුතු අතර, ඒ ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනය විසින් ඒ වාර්තාව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද, එසේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශය මඟින් ඒ අක්වෙරළ සමාගමේ අක්වෙරළ බැංකු ව්‍යාපාරය සම්බන්ධයෙන් සත්‍ය සහ සාධාරණ දැක්මක් සපයන්නේ ද යන්න සහ ඒ සමාගම අඛණ්ඩ පැවැත්මක් ඇති සමාගමක් ලෙස පවතින්නේ ද යන්න ද අනෙකුත් කාරණා අතර එහි සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) ඒ විගණන වාර්තාවේ සහතික කළ පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනය ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව සිය කාර්ය ඉටු කර නොමැති බව කොමිෂන් සභාවේ අදහස වන්නේ නම්, කොමිෂන් සභාව විසින් ඒ හා සමාන තත්ත්වයක් සහ කීර්තිනාමයක් ඇති වෙනත් ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනයකින් අලුත් විගණන වාර්තාවක් ඉල්ලා සිටිය හැකි ය.

*කොමිෂන් සභාව විසින් ඇතැම් අවස්ථානුගත තත්ත්වයන් හි දී පරීක්ෂණයක් කරනු ලැබිය හැකි බව සහ සීමාවන් පැනවිය හැකි බව*

**49.** (1) (අ) ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනය විසින් විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීමට අපොහොසත්ව ඇති බව;

(ආ) ඉහත සඳහන් කරන ලද විගණන වාර්තාවෙහි යම් අප්‍රමාණවත් තත්ත්වයක් ඇති බව;

(ඇ) අදාළ සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳව සැක කිරීමට හෝ ඒ සමාගම වංචනික, අනාරක්ෂිත හෝ නුසුදුසු බැංකු පරිචයන්වල නිරත වන බවට සැක කිරීමට සාධාරණ හේතු ඇති බව; හෝ

(ඈ) අදාළ සමාගම, සිය අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී, මේ පනතේ මේ කොටස යටතේ ඇති නියමයන්ට අනුකූලව වීම පැහැර හැර ඇති බව,

පෙනී යන්නේ නම්, මේ පනතේ මේ කොටස ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කොට ඇති යම් අක්වෙරළ සමාගමක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාව විසින් එහි යම් නිලධරයකුට හෝ තත්කාර්යය කොමිෂන් සභාව විසින් සඳහා බලය දෙන ලද යම් නිසි තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව පරීක්ෂණයක් අවසන් කර වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව, අක්වෙරළ බැංකු ව්‍යාපාරයේ නිරත ඒ බලයලත් තැනැත්තා, වංචනික, අනාරක්ෂිත හෝ නුසුදුසු බැංකු පරිචයන්වල නිරත වන බවට හෝ එහි මූල්‍ය ස්ථාවරත්වය සැක සහිත බව තහවුරු වුවහොත්, කොමිෂන් සභාව විසින්, මුදල් මණ්ඩලයේ එකඟත්වය ඇතිව, අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් යම් සීමා කිරීම් පැනවීම හෝ දණ්ඩනයක් පැනවීම හෝ සුදුසු යයි සලකනු ලබන වෙනත් කොන්දේසි පැනවීම සිදු කරනු ලැබිය හැකි ය.

පොත් සහ ගිණුම් පවත්වාගෙන යාම

**50.** මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි කර ඇති සෑම සමාගමක් විසින් ම, අදාළ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පොත්, සටහන්, ගිණුම්, මුදල් බැඳුම්කර, වවුචර් පත්‍ර, වෙනත් ලේඛන සහ වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

තොරතුරු කැඳවීම සඳහා මුදල් මණ්ඩලයට ඇති බලය

**51.** මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට යටත්ව, මුදල් මණ්ඩලය විසින්, කලින් කලට, කොමිෂන් සභාව හරහා, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා අවශ්‍ය යයි එය සලකන තොරතුරු සහ වාර්තා කැඳවිය හැකි ය.

IX වන කොටස

### ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර නිශ්චය කිරීම සහ ඒ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම

ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවලට නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම

**52.** (1) වෙනත් යම් නීතියක ඇතුළත් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනතේ මේ කොටස යටතේ අනුමත කරනු ලැබිය හැකි ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් කරගෙන යන යම් බලයලත් තැනැත්තකුට මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, කොමිෂන් සභාව විසින්, ජනාධිපතිවරයා හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විමසා, ජාතික යහපත සැලකිල්ලට ගෙන හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස, කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ අරමුණුවල සාර්ථකත්වය සාක්ෂාත් කර ගැනීම සහතික කරන්නා වූ "ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර" යනුවෙන් නම් කරනු ලැබිය හැකි ව්‍යාපාර හඳුනා ගනු ලැබිය හැකි ය.

(3) යම් ව්‍යාපාරයක් ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස හඳුනා ගැනීමෙන් පසුව, ඒ ව්‍යාපාරයට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ස්වකීය කටයුතු කිරීමට අදාළ වන තාක් දුරට නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මේ පනතේ මේ කොටසේ විධිවිධාන සලසා ඇති පරිදි ප්‍රදානය කරනු ලැබිය හැකි ය. බදු හා සම්බන්ධ නිදහස් කිරීම් සම්බන්ධයෙන් වන විට, ඒ නිදහස් කිරීම් II වන උපලේඛනයේ දක්වා ඇති සියලුම හෝ යම් නීතිවලින් සහ මුළුමනින් ම හෝ කොටසක් වශයෙන් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්, මේ පනතේ 32 වන වගන්තියේ සඳහන් කොමිෂන් සභාව සහ බලයලත් තැනැත්තා විසින් හෝ අතර හෝ අත්සන් කරනු ලැබිය යුතු ගිවිසුමේ ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ මේ කොටසේ විධිවිධාන සලසා ඇති පරිදි, නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ අවශ්‍ය විය හැකි යම් වැඩිදුර මාර්ගෝපදේශ නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(6) කොමිෂන් සභාව විසින්, කොළඹ වරාය නගරයට ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීම සඳහා දිරිගැන්වීම් ලෙස අවශ්‍ය විය හැකි වෙනත් සහාය හෝ පහසුකම් ද සලසා දෙනු ලැබිය හැකි ය.

(7) මේ වගන්තිය ප්‍රකාරව ප්‍රදානය කරන ලද ඒ නිදහස් කිරීම්වල හෝ දිරිගැන්වීම්වල වලංගු කාලසීමාව, අවුරුදු හතළිහ නො ඉක්මවිය යුතු ය.

ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල විස්තර, නියමයක් මඟින් නිශ්චිතව දැක්විය යුතු බව

**53.** (1) ව්‍යාපාරයක්, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස හඳුනා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් මේ පනතේ 52 වන වගන්තිය ප්‍රකාරව ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීමට සහ යම් නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමට අදාළ නිර්දේශ ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින්, ඒ නිර්දේශ සලකා බලා ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස ,මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, මේ පනතේ 52 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ඒ ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීමට සහ ඒ ව්‍යාපාරයට නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතය ලබා ගැනීම සඳහා-

(අ) ඒ ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු;

(ආ) මේ පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් අතරින්, ඒ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාළ වීමෙන් නිදහස් කිරීමට යෝජනා කරන නිශ්චිත පනත් කවරේද යන්න සහ වෙනත් යම් දිරිගැන්වීම්;

(ඇ) ඒ නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ආරම්භ කිරීමට යෝජිත දිනය සහ ඒ ආරම්භ වන දින සිට අවුරුදු හතළිහක් නොඉක්ම විය යුතු, ඒ නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් ක්‍රියාත්මක වීම අවසන් විය යුතු දිනය;

(ඈ) ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස හඳුනා ගනිමින් සිටින ව්‍යාපාරයේ ඉල්ලුම්කරුගේ නම,

පිළිබඳව අමාත්‍ය මණ්ඩලයට දැනුම් දීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(3) අමාත්‍ය මණ්ඩලය විසින්, ව්‍යාපාරයක්, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කරනු ලැබූ සහ අනුමත කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කරනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින්, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මඟින්-

(අ) ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු;

(ආ) මේ පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් අතරින් ඒ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාළ වීමෙන් නිදහස් වන නිශ්චිත පනත් කවරේද යන්න සහ ප්‍රදානය කරන ලද වෙනත් යම් දිරිගැන්වීම්;

(ඇ) ඒ නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් ආරම්භ වන දිනය සහ ඒවා ක්‍රියාත්මක වීම අවසන් වන දිනය; සහ

(ඈ) ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස හඳුනා ගනු ලැබූ ව්‍යාපාරයේ ඉල්ලුම්කරුගේ නම,

නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වන නියමය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට දින තිහක් ඉක්ම වූ පසු, නිවේදනයේ දක්වා ඇති නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මේ පනතේ IX කොටසේ විධිවිධානවලට අනුකූල වන බව තහවුරු කරමින් කොමිෂන් සභාවේ අත්සන යටතේ නිකුත් කරන ලද ලිඛිත තහවුරු කිරීමක් සමඟ ඒ නියමය දැන ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, "ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරය" යන්නෙන්, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස, රටට ආර්ථික සහ සමාජයීය ප්‍රතිලාභ ගෙන ඒමට හැකියාව ඇත්තා වූ ද, නැතහොත් කොළඹ වරාය නගරයේ භූමි දර්ශනය වෙනස් කිරීමට හැකියාව ඇත්තා වූ ද, නැතහොත් මූලික වශයෙන් ම-

(අ) යෝජිත ව්‍යාපාරය හා බැඳුනු ක්‍රමෝපාය වැදගත්කම;

(ආ) ඒ ව්‍යාපාරය වෙතට හෝ ඒ ව්‍යාපාරය හරහා ජනනය කිරීමට අපේක්ෂිත සෘජු විදේශ ආයෝජනයක් ලෙස, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළට විදේශ විනිමය ගලා ඒම;

(ඇ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සේවා නියුක්තයන්ට ශ්‍රී ලංකා රුපියල් වලින් හැර නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් ආදායම් ඉපයීමේ අවස්ථා ඇති කරනු ලබන සේවානියුක්තීන් ඇති කිරීම;

(ඈ) සේවාවන් ප්‍රවර්ධනය කිරීම හෝ තොරතුරු තාක්ෂණය ඇතුළු තාක්ෂණය දියුණු කිරීම හෝ භාවිත කිරීම ප්‍රකාරව, අපේක්ෂිත දැනුම් පරිවර්තනය;

(ඉ) සංචාරක ව්‍යාපාරය, විනෝදාත්මක කටයුතු සහ සාප්පු සවාරි ක්‍රියාකාරකම් හෝ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ නේවාසික ප්‍රජාවක් පදිංචි කරවීම මඟින් නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම හරහා ශ්‍රී ලංකාව වෙතට වූ අපේක්ෂිත ගමනාන්ත ප්‍රවර්ධනය; සහ

(ඊ) යම් සංස්ථාපිත මූලස්ථාන මෙහෙයුම් සහ කලාපීය බෙදා හැරීම් මෙහෙයුම් ස්ථාපිත කිරීම මඟින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සේවාවන් ප්‍රවර්ධනය කිරීම හරහා අපේක්ෂිත ගාමක බලය ඇති කිරීම,

මඟින් ගෝලීය හෝ කලාපීය ව්‍යාපාර හෝ සේවා සම්බන්ධීකරණයන් ඇති කිරීමේ හැකියාව ඇත්තා වූ ද, කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම ඉලක්ක කරනු ලබන ව්‍යාපාරයක් අදහස් වේ.

X වන කොටස

## සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත සහ බද්ධ නිවාස අයිතිකම් පනත අදාළ වීම

කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත සහ බද්ධ නිවාස අයිතිකම් පනත අදාළ වීම

**54.** (1) මේ පනත ආරම්භ වන දින සිට හෝ ඉන්පසුව, මෙහි ඊට පටහැනිව අන්‍යාකාරයෙන් සඳහන් කරනු ලැබ ඇත්තේ නම් මිස, සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත සහ බද්ධ නිවාස අයිතිකම් පනත, මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, (2) වන උපවගන්තියේ දක්වා ඇති ආකාරයට සහ වෙනස්කිරීම්වලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ බලපැවැත්විය යුතු ය:

එසේ වුව ද, සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත හෝ බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ සාදන ලද සහ මේ පනත ආරම්භ වන දිනයේ දී බලාත්මකව පවතින නියෝග ද මේ පනත යටතේ නියෝග සාදනු ලබන තෙක් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

එසේම තවදුරටත්, සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත හෝ බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ සාදන ලද සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන යම් නියෝගයක්, මේ පනතේ මේ කොටස ප්‍රකාරව ඊට අනුරූප නියෝගයක් සෑදීමෙන් පසුව මේ පනත යටතේ සාදන ලද ඒ නියෝගය ක්‍රියාත්මක වන දින සිට බලාත්මක වන පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වීම නතර විය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දින සිට හෝ ඉන් පසුව, කොමිෂන් සභාව විසින්, එකී සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත සහ බද්ධ නිවාස අයිතිකම් පනත කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන යම් අවස්ථාවක දී, සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය සතු වන හෝ ඊට පවරන ලද සියලු හෝ යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය එකී සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ සහ එකී බද්ධ නිවාස අයිතිකම් පනතේ -

(අ) "සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය" ට කරන ලද සඳහනක්, මේ පනත යටතේ පිහිටුවන ලද "කොළඹ

වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවට" කරන ලද සඳහනක්; සහ

(ආ) "අමාත්‍යවරයා"ට කරන ලද සඳහනක්, "ජනාධිපතිවරයා"ට හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ "අමාත්‍යවරයා" ට කරන ලද සඳහනක්,

පරිද්දෙන්, ඒ හා සමාන ආකාරයකින්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව විසින් සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරියේ එකඟත්වය ඉල්ලීම කළ හැකි බව

**55.** (1) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, කොමිෂන් සභාව විසින් මේ පනතේ නිශ්චිතව විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට, සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරියේ එකඟත්වය ලබා ගත යුතු ය.

(2) සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විසින් අවස්ථානුගත කරුණු අනුව ප්‍රමුඛතා කරුණක් ලෙස සලකා, ඒ එකඟත්වය කොමිෂන් සභාව වෙත ලබා දිය යුතු ය.

(3) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සභාධිපත්‍ය දේපළ ඉදි කිරීම කඩිනම් ආකාරයෙන් සිදු කරනු ලබන බවට සහතික වීම සඳහා, කොමිෂන් සභාව විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ කාර්යාලයක් පවත්වාගෙන යන ලෙසට සමාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරියට නියම කරනු ලැබිය හැකි ය. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පනතේ සහ බද්ධ නිවාස අයිතිකම් පනතේ විධිවිධාන කඩිනමින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨතාවක් සහ අධිකාරි බලයක් සහිත නිලධරයන් විසින් ඒ කාර්යාලය කළමනාකරණය කරනු ලබන බවට සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විසින් සහතික විය යුතු ය.

## XI වන කොටස

### සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අදාළ වීම

කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ව්‍යාපාර වස්තු හුවමාරුවක් හෝ වෙළඳපොළක් මෙහෙයවීම

**56.** (1) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ සහ ඒ පනත යටතේ සාදනු ලබන නියෝගවල විධිවිධාන ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ මෙහෙයවනු ලබන යම් ව්‍යාපාර වස්තු හුවමාරුවක් හෝ වෙළඳපොළක් විසින් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ නිකුත් කිරීම විධිමත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා "සුරැකුම්පත්" යන්නෙන්, යම් ආණ්ඩුවක් විසින් හෝ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් මණ්ඩලයක් විසින් හෝ නිකුත් කරන ලද නැතහොත් නිකුත් කිරීමට යෝජිත යම් අයිතිවාසිකමක්, වරණයක් හෝ (ඒකක වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ විස්තර කරන ලද්දේ වුව ද) එහි හෝ ඒ පිළිබඳ වූ සම්බන්ධතාවයක් ද ඇතුළුව ණයකර, ව්‍යාපාර වස්තු, කොටස්, අරමුදල්, බැඳුම්කර, පාදක කරගනු ලබන වත්කමේ ගති ලක්ෂණ, වරණයන් සහ ස්වභාවය කුමක් වුව ද, ව්‍යුත්පන්න හෝ නෝට්ටු හෝ සුරැකුම්පත් යනුවෙන් සමාන්‍යයෙන් හඳුන්වනු ලබන වෙනත් යම් සාධනපත්‍ර අදහස් වන අතර, එහෙත්, විනිමය බිල්පත් හෝ පොරොන්දු නෝට්ටු හෝ බැංකුවක් විසින් නිකුත් කරන ලද තැන්පතු සහතික ඊට ඇතුළත් නොවේ.

කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අදාළ වීම

**57.** (1) මේ පනත ආරම්භ වන දින සිට හෝ ඉන්පසුව, මෙහි ඊට පටහැනිව අන්‍යාකාරයෙන් සඳහන් කරනු ලැබ ඇත්තේ නම් මිස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත, මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, (2) වන උපවගන්තියේ දක්වා ඇති ආකාරයට සහ වෙනස් කිරීම්වලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ බලපැවැත්විය යුතු යː

එසේ වුව ද, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ සාදන ලද සහ මේ පනත ආරම්භ වන දිනයේ දී බලාත්මකව පවතින යම් නියෝගයක් ද, මේ පනතේ මේ කොටස යටතේ

නියෝග සාදනු ලබන තෙක් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ සාදන ලද සහ ඉහත කී පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන යම් නියෝගයක්, මේ පනතේ මේ කොටස ප්‍රකාරව ඊට අනුරූප නියෝගයක් සෑදීමෙන් පසුව, මේ පනත යටතේ ඒ නියෝගය ක්‍රියාත්මක වන දින සිට බලාත්මක වන පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වීම නතර විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, මේ පනතේ මේ කොටස ප්‍රකාරව නිශ්චිතව විධිවිධාන සලස්වා ඇති ප්‍රමාණයට, සිය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ප්‍රකාරව එසේ කිරීම අවශ්‍ය යයි නියම කරනු ලබන අවස්ථාවක දී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතු වන හෝ ඊට පවරන ලද විෂයයන් සම්බන්ධයෙන්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එකඟත්වය ලබා ගත යුතු ය.

(3) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින, ඒ එකඟත්වය, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට සීමා කරනු ලැබිය යුතු අතර, එකී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන තේරුම් ගැනීමේ දී, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා අවශ්‍ය වන තාක් දුරට-

(අ) "සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" ට කරන ලද සඳහනක් මේ පනත යටතේ පිහිටුවන ලද "කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව" ට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය; සහ

(ආ) "අමාත්‍යවරයා" ට කරන ලද සඳහනක් "ජනාධිපතිවරයා" ට හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ "අමාත්‍යවරයා" ට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එකඟත්වය ලබා ගැනීම

**58.** (1) කොමිෂන් සභාව විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් එකඟත්වය ඉල්ලා සිටින අවස්ථාවක, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අවස්ථානුගත කරුණු අනුව, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, ප්‍රමුඛත්වය ලබාදිය යුතු කරුණක් ලෙස සලකා, කොමිෂන් සභාව වෙත ඒ එකඟත්වය ලබා දෙනු ලැබිය යුතු ය.

(2) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ව්‍යාපාර වස්තු හුවමාරු හෝ වෙළඳපළ මෙහෙයුම් කඩිනම් ආකාරයෙන් සිදු කරනු ලබන බවට සහතික වීම සඳහා කොමිෂන් සභාව විසින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ කාර්යාලයක් පවත්වාගෙන යන ලෙසට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට නියම කරනු ලැබිය හැකි ය. ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨතාවක් සහ අධිකාරි බලයක් සහිත නිලධරයන් විසින් ඒ කාර්යාලය කළමනාකරණය කරනු ලබන බවට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සහතික විය යුතු ය.

## XII වන කොටස

### දේපළ කළමනාකරු සහ සාමාන්‍ය සේවාවන් සැපයීම

දේපළ කළමනාකරු

**59.** කොමිෂන් සභාව විසින් කලින් කලට පවරනු ලැබිය හැකි වෙනත් සේවාවන් ද ඇතුළුව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ මෙහි පහත දක්වා ඇති සේවාවන් සැපයීම සඳහා, 2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාගත කරන ලද්දා වූ ද දේපළ කළමනාකරු ලෙස නම් කරනු ලැබිය යුතු වූ ද සමාගමක් තිබිය යුතු ය.

දේපළ කළමනාකරුගේ බලතල

**60.** දේපළ කළමනාකරු, කොමිෂන් සභාවේ විධානය සහ අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලැබිය යුතු අතර, පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය:-

(අ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිටින බලයලත් තැනැත්තන්ට, වාසිකයන්ට, පදිංචිකරුවන්ට සහ ආගන්තුකයන්ට ගෑස්, ජලය, විදුලිය, අන්තර්ජාල සහ සන්නිවේදන පහසුකම්, මලාපවහනය සහ ජලාපවහනය, අපද්‍රව්‍ය හා කැළිකසළ බැහැර කිරීම වැනි උපයෝගීතා සේවාවන් සහ එවැනි වෙනත් පහසුකම් සැලසීමේ දී සේවා සපයන්නන්ට සහාය වීම;

(ආ) වීථි ආලෝකකරණය සහ එවැනි වෙනත් පහසුකම් පවත්වාගෙන යාම ඇතුළු සියලු පොදු ප්‍රදේශ කළමනාකරණය සහ පවත්වා ගෙන යාම;

(ඇ) මේ පනත මඟින් බලය දී ඇති පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ කොමිෂන් සභාව විසින් පනවන ලද, ප්‍රදේශවලට අදාළ බදු සහ අයබදු එකතු කිරීමට පහසුකම් සැලසීම සහ කළමනාකරණ ගාස්තු, උපයෝගීතා අයකිරීම්, වාහන ගාල් කිරීමේ අයකිරීම්, භාවිත කිරීමේ ගාස්තු සහ එවැනි වෙනත් ගාස්තු හෝ අයකිරීම් ඇතුළු කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සපයනු ලබන සේවාවන් සඳහා වන ගාස්තු සහ අයකිරීම්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිටින බලයලත් තැනැත්තන්ගෙන්, බලයලත් තැනැත්තන්ගේ සේවා නියුක්තයන්ගෙන්, වාසිකයන්ගෙන්, පදිංචිකරුවන්ගෙන් සහ ආගන්තුකයන්ගෙන් එකතු කිරීම;

(ඈ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ වාහන ගාල් කිරීමේ ස්ථාන වැනි පොදු භාවිත පහසුකම් ඇති කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම;

(ඉ) කොළඹ වරාය නගරයේ අක්වෙරළ දියකඩනය සහ වෙරළවල් අතර ඇති ජලතීරයන්, අභ්‍යන්තර ඇළ මාර්ග සහ එවැනි වෙනත් ප්‍රදේශ පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම සඳහා වගකිව යුතු වීම;

(ඊ) කොමිෂන් සභාව විසින් පනවනු ලබන සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළට අදාළ දේශීය වරිපනම්, බදු, අය බදු සහ එවැනි වෙනත් අයකිරීම් කොමිෂන් සභාව වෙනුවෙන් එකතු කිරීම සහ එසේ එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය, කොමිෂන් සභාව විසින් විධාන කරනු ලබන පරිදි බැංකු ගිණුමකට බැර කිරීම;

(උ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සපයනු ලබන සේවාවන් හි කොටසක් වන, අවශ්‍ය විය හැකි පරිදි, නැව් ජැටිගත කිරීමේ ගාස්තු අය කිරීම;

(උෟ) සංවර්ධන පාලන නියෝගවලට අනුකූලවීමට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ බලයලත් තැනැත්තන්ගේ, බලයලත් තැනැත්තන්ගේ සේවා නියුක්තයන්ගේ, නේවාසිකයන්ගේ, පදිංචිකරුවන්ගේ සහ ආගන්තුකයන්ගේ සියලු ආකාරයේ කැළිකසළ දිනපතා එකතු කිරීම, වෙන් කිරීම සහ ඉවත් කිරීම සහ බැහැර කිරීම සහතික කරනු ලබන අතරතුර, කාර්යක්ෂම සහ ඵලදායී කැළිකසළ එකතු කිරීමේ සහ බැහැර කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු වීම සහ අවශ්‍ය අවස්ථාවල දී, බාහිර ප්‍රභවයන්ට ලබා දීමේ ගිවිසුම් ඇතුළු යම් තෙවන පාර්ශ්වයක් සමග යම් අදාළ ගිවිසුම්වලට ඇතුළත් වීම;

(එ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇති මාර්ග හෝ ප්‍රවේශ මාර්ග සම්බන්ධයෙන් වන සියලු කාරණා අධීක්ෂණය කිරීම සහ පරිපාලනය කිරීම සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිටින බලයලත් තැනැත්තන්, බලයලත් තැනැත්තන්ගේ සේවා නියුක්තයන්, වාසිකයන්, පදිංචිකරුවන් සහ ආගන්තුකයන්ගේ පහසුකම් සහ සුභසාධනය සුරැකීම සහ ප්‍රවර්ධනය කිරීම; සහ

(ඒ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිටින බලයලත් තැනැත්තන්, බලයලත් තැනැත්තන්ගේ සේවා නියුක්තයන්, වාසිකයන්, පදිංචිකරුවන් සහ ආගන්තුකයන් වඩාත් හොඳින් කළමනාකරණය කිරීම සහ ඔවුන්ගේ සුභසාධනය උදෙසා කොමිෂන් සභාව විසින් විධානය කරනු ලැබිය හැකි වෙනත් දේ කිරීම.

දේපළ කළමනාකරු බලයලත් තැනැත්තකු වන බව

**61.** දේපළ කළමනාකරු බලයලත් තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත ප්‍රකාරව නිශ්චිතව දක්වා ඇති බලයලත් තැනැත්තකුගේ සියලු ප්‍රතිලාභ සහ වරප්‍රසාදවලට ඔහු හිමිකම් ලබන්නේ ය.

## XIII වන කොටස

### ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය

ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීමට පහසුකම් සැලැස්වීම

**62.** (1) සමාදාන කිරීම, සමථකරණය, විනිශ්චය කිරීම, බේරුම් කිරීම සහ වෙනත් යම් විකල්ප ආරාවුල් නිරවුල් කිරීමේ සේවාවන් සැපයීමේ කාර්ය සඳහා, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සංස්ථාපිත කරනු ලැබිය යුතු හා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ස්ථානගත කළ යුතු ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීමට කොමිෂන් සභාව විසින් පහසුකම් සලසනු ලැබිය යුතු ය.

(2) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ-

(අ) කොමිෂන් සභාව සහ බලයලත් තැනැත්තකු හෝ අදාළ වන අවස්ථාවක, බලයලත් තැනැත්තකුගේ සේවා නියුක්තයකු අතර; සහ

(ආ) කොමිෂන් සභාව සහ වාසිකයකු හෝ පදිංචිකරුවකු අතර යම් ගිවිසුමක් හෝ වෙනත් නීතිමය බැඳීමක් ඇති ලේඛනයක් ඇත්නම්, කොමිෂන් සභාව සහ ඒ වාසිකයා හෝ පදිංචිකරු අතර,

ඇතිවිය හැකි යම් ආරාවුලක් (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන බේරුම්කරණය මාර්ගයෙන් විසඳාගනු ලැබිය යුතු ය.

(3) පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව යම් බලයලත් තැනැත්තකු විසින් එළඹෙන ලද සියලුම ගිවිසුම්වල, ඒ ගිවිසුම් යටතේ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇතිවිය හැකි යම් ආරාවුලක් මේ වගන්තිය ප්‍රකාරව අනිවාර්යයෙන් ම බේරුම්කරණය සඳහා යොමු කළ යුතු බවට නියම කෙරෙන විධිවිධානයක්, ඇතුළත් විය යුතු බවට සෑම බලයලත් තැනැත්තකු විසින් ම වග බලා ගනු ලැබිය යුතු ය.

(4) සමාදාන කිරීම, සමථකරණය, විනිශ්චය කිරීම, බේරුම් කිරීම සහ ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානයෙන් ප්‍රදානය කරනු ලබන වෙනත් යම් විකල්ප ආරාවුල් නිරවුල් කිරීමේ සේවාවන් සඳහා කාර්ය පටිපාටිමය රීති සැදීමට හෝ යොදා ගැනීමට ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානයට හිමිකම ඇත්තේ ය.

(5) මේ පනත යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය මඟින් කරනු ලබන යම් බේරුම්කරණ ප්‍රදානයක් 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනතේ විධිවිධානවලට අනුව බලාත්මක කරනු ලැබිය යුතු ය.

(6) ශ්‍රී ලංකාවේ පුරුවැසියකු හෝ වාසිකයකු විසින් (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානයේ කටයුතු හෝ යම් ක්‍රියාකාරකම්වල කවර හෝ තත්ත්වයකින් සේවය කරනු ලැබිය හැකි අතර, ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් වෘත්තිකයකුට ද එසේ සම්බන්ධ විය හැකි ය.

XIV වන කොටස

**නඩු කටයුතු විභාග කිරීමේ පූර්වතාව**

අධිකරණ විසින් නඩු කටයුතුවලට පූර්වතාව ලබා දිය යුතු බව

**63.** (1) නඩු නිමිත්ත කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ උද්ගත වන හෝ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් උද්ගත වන අවස්ථාවක, යම් සිවිල් හා වාණිජ කාරණා සම්බන්ධයෙන් පවරන ලද යම් නඩු කටයුතු, වෙනත් කරුණු අතර, ඒ නඩු කටයුතු කඩිනමින් විසඳා අවසන් කිරීම සහතික කිරීම පිණිස, දෛනික පදනමින් වේගවත්ව විභාග කිරීම සඳහා අධිකරණ විසින් පූර්වතාවක් ලබා දිය යුතු ය.

(2) ව්‍යාපාර කටයුතු පහසු කිරීමේ දී හා ගිවිසුම් බලාත්මක කිරීමේ දී, ජාත්‍යන්තර ආයෝජකයාගේ විශ්වාසය වර්ධනය කිරීම පිණිස සහ ජාතික යහපත හා ජාතික ආර්ථිකය දියුණු කිරීමේ යහපත පිණිස, යම් නිශ්චිත නීතිඥවරයකුට යම් නිශ්චිත දිනයක දී (ඒ දිනයේ දී ම වෙනත් යම් අධිකරණයක හෝ විනිශ්චය සභාවක පෙනී සිටීමට ගිවිස ගෙන තිබීම ඇතුළුව) පෞද්ගලික හේතු මත අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට නොහැකි වීම නඩු විභාගය ආරම්භ කිරීම හෝ පවත්වා ගෙන යාම කල් දැමීම සඳහා වන හේතුවක් නොවිය යුතු ය; නැතහොත් එසේ කල් දැමීම සඳහා අවසර හිමි වන විශේෂිත හේතුවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

## XV වන කොටස

### අන්තර්කාලීන විධිවිධාන සහ ආයෝජන ආරක්ෂාව

අන්තර්කාලීන පියවරයක් ලෙස, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාරවල නිරත වීමට බලයලත් තැනැත්තකුට අවසර දිය යුතු බව

**64.** (1) කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවල දී, අන්තර්කාලීන පියවරක් ලෙස, මේ පනත ආරම්භ වන දින සිට අවුරුදු පහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා, ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී, ඒ අමාත්‍යවරයා විසින්, අනුමත කරනු ලැබිය හැකි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ශ්‍රී ලංකාවේ යම් නම් කරනු ලබන ස්ථානයක සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට, යම් බලයලත් තැනැත්තකුට අවසර දෙනු ලැබිය හැකි ය. ඒ ව්‍යාපාරය විසින් ඒ අවුරුදු පහක කාලසීමාව සඳහා, දෙනු ලබන සියලු වරප්‍රසාදවලට හිමිකම් ලැබිය යුතු අතර, සියලු කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ව්‍යාපාරයක් ලෙස සහ ඒ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරතවන ව්‍යාපාරයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත, ශ්‍රී ලංකාවේ යම් නම් කරනු ලබන ස්ථානයක සිට ව්‍යාපාර කටයුතුවල නිරතවීමට යම් බලයලත් තැනැත්තකුට අවසර දී ඇති අවස්ථාවක, ඒ ව්‍යාපාරය, මේ පනතේ විධිවිධානවලට සහ මේ යටතේ සාදන ලද යම් නියෝගවලට යටත් විය යුතු ය.

**නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලියා අත්සන් කරනු ලබන යම් පැවරීමක්, බද්දක් හෝ ගිවිසුමක්, කොමිෂන් සභාව විසින් ලියා අත්සන් කරනු ලැබූ ලේඛන ලෙස සලකනු ලැබිය යුතු බව**

**65.** (1) මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන්පසුව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අයත් වන සියලු ඉඩම්, (3) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය විසින්, මේ පනත ආරම්භ වීමට පෙරාතුව, යම් පැවරුම් ඔප්පුවක්, බදු ඔප්පුවක්, ගිවිසුමක් හෝ එවැනි වෙනත් සමාන ලේඛනයක්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති යම් ඉඩමක් සම්බන්ධයෙන් ලියා අත්සන් කර ඇති අවස්ථාවක, ඒ පැවරුම් ඔප්පුව, බදු ඔප්පුව, ගිවිසුම හෝ වෙනත් සමාන ලේඛනය, මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන්පසුව සියලු කාර්ය සඳහා, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ලියා අත්සන් කරනු ලැබූ ලේඛනයක් ලෙස සැලකිය යුතු අතර, එය මේ යටතේ ලියා අත්සන් කරනු ලැබුවාක් මෙන් වලංගු හා බලාත්මක විය යුත්තේ ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව ජනාධිපතිවරයා විසින්, මේ පනතේ I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය සමන්විත වන සියලු ඉඩම් සම්බන්ධයෙන්, (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනත යටතේ කොමිෂන් සභාව නමට ඉඩම් ප්‍රදානයක් කරනු ලැබිය හැකි බවට සැක දුරු කිරීමේ කාර්යය සඳහා මෙයින් සඳහන් කරනු ලැබේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් එළඹෙන ලද ගිවිසුම්, කොමිෂන් සභාව විසින් එළඹෙන ලද ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු බව

**66.** මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩලය පනත සහ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන ආයෝජනයකට අදාළව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් යම් ගිවිසුමකට එළඹ ඇති අවස්ථාවක සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන ආයෝජනයකට අදාළව, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව ගැසට් පත්‍රයේ නියමයක් පළ කරනු ලැබ ඇති අවස්ථාවක, මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, සියලු කාර්ය සඳහා, පිළිවෙලින්, මේ පනතේ 32 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් එළඹෙන ලද ගිවිසුමක් ලෙස සහ මේ පනතේ IX වන කොටස යටතේ පළ කරන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එය මේ යටතේ ක්‍රියාත්මක වූ ලෙස වලංගු හා බලාත්මක විය යුත්තේ ය.

මේ පනත යටතේ ප්‍රදානය කරන ලද ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබාදීම ආදිය ඒවායේ කාලය ඉකුත් වන තෙක්, සංශෝධනය කිරීමකින් හෝ අවසන් කිරීමකින් තොරව අඛණ්ඩව පැවතිය යුතු බව

**67.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව වුව ද, මේ පනත ප්‍රකාරව ප්‍රදානය කරන ලද කිසිදු ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබා දීමක්, අවසර පත්‍රයක් හෝ වෙනත් යම් අනුමතයක්, හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන, යම් පැවරුම් ඔප්පුවක්, බදු ඔප්පුවක් හෝ ගිවිසුමක් ලියාපදිංචි කිරීමේ, බලපත්‍රයේ, බලය ලබාදීමේ, අවසර පත්‍රයේ හෝ වෙනත් අනුමතයේ, හෝ ඒ පැවරුම් ඔප්පුවේ, බදු ඔප්පුවේ හෝ ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති කාලපරිච්ඡේදය හෝ කාලසීමාව ඉකුත් වීමෙන් හෝ අවසන් වීමෙන් පසුව හැර, අදාළ ආයෝජකයාගේ යහපතට අගතිදායක වන යම් ආකාරයකට අවසන් කිරීම හෝ සංශෝධනය කිරීම සිදු නොකළ යුතු යː

එසේ වුව ද -

(අ) අදාළ පාර්ශ්ව අතර ඇති වන ගිවිසුමක් මත;

(ආ) අදාළ ලේඛනයේ අන්තර්ගත නියමයක් හෝ කොන්දේසියක් කඩ කිරීමේ හේතුවෙන්; හෝ

(ඇ) මේ පනතේ ඇතුළත්, අවසන් කිරීම සඳහා විධිවිධාන සලසා ඇති යම් ප්‍රකාශිත විධිවිධානයක් හේතුවෙන්,

කලින් අවසන් කිරීම හෝ සංශෝධනය කිරීම සිදුවිය හැකි ය.

## XVI වන කොටස

## විවිධ විධිවිධාන

**68.** (1) වෙනත් යම් නීතියක අන්තර්ගත විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ - වැරදි

(අ) මේ පනත ප්‍රකාරව, පිහිටුවීම, ආරම්භ කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් යම් අනුමතයක් අවශ්‍ය වන යම් ව්‍යාපාරයක්, එවැන්නක් ලබා නොගෙන පිහිටුවන, ආරම්භ කරන හෝ ක්‍රියාත්මක කරන;

(ආ) මේ පනත ප්‍රකාරව ප්‍රදානය කරන ලද යම් ලියාපදිංචි කිරීමක, බලපත්‍රයක, බලය ලබා දීමක හෝ වෙනත් යම් අනුමතයක ඇති යම් විධිවිධානයක් කඩ කරමින් බලයලත් තැනැත්තකු ලෙස ව්‍යාපාර කටයුතුවල නිරත වන;

(ඇ) මේ පනත යටතේ ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලුම් පත්‍රයක, යම් වැදගත් තොරතුරක් සම්බන්ධයෙන් සාවද්‍ය හෝ නොමඟ යවනසුලු බවට තමා දන්නා යම් නියෝජනයක් හෝ ප්‍රකාශයක් කරනු ලබන;

(ඈ) මේ පනත ප්‍රකාරව හෝ වෙනත් යම් අදාළ ලිඛිත නීතියක් ප්‍රකාරව, යම් තොරතුරක්, ලේඛන හෝ විස්තර ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකුට නියම කරනු ලබන විට, සාවද්‍ය තොරතුරු, ලේඛන හෝ විස්තර ඉදිරිපත් කරනු ලබන;

(ඉ) මේ පනත ප්‍රකාරව සාදනු ලබන යම් නියෝගයක් කඩකරන හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන; හෝ

(ඊ) මේ පනත ප්‍රකාරව සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන යම් රීතියක්, සංග්‍රහයක්, විධානයක් හෝ මාර්ගෝපදේශයක් කඩකරන හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන,

යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියන එකකට අඩු නොවන සහ රුපියල් මිලියන පහකට වැඩි නොවන දඩයකට හෝ මාස තුනකට අඩු නොවන සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක බන්ධනාගාරගත කිරීමකට, හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය. තව ද, ඒ දඩයේ ප්‍රමාණය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව තීරණය කිරීමේ දී, කරන ලද වරදේ බරපතළ ස්වභාවය අධිකරණය විසින්, සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාරව යම් තැනැත්තකු, වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් සිය අභිමතය මත, ඒ තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, නියමිත ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබා දීම හෝ ඒ වෙනත් අනුමතය ලබා නොගෙන නිරතව සිටියා වූ ද දැනට නිරතවීම තහනම් කොට ඇත්තා වූ ද ඒ ව්‍යාපාරය, ඔහු විසින් නියමිත ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් අනුමතයක් ලබාගන්නා තෙක්, නිශ්චිතව දක්වනු ලැබිය යුතු කාලසීමාවක් සඳහා වහාම බලාත්මක වන පරිදි නිරත වීමෙන් වළකින ලෙසට වූ අතිරේක නියමයක් කරනු ලැබිය හැකි ය.

(3) (අ) වෙනත් යම් නීතියක අන්තර්ගත විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන, නිකුත් කරනු ලබන හෝ පනවනු ලබන යම් නියෝගයක, රීතියක, විධානයක, නියමයක හෝ අවශ්‍යතාවයක විධිවිධානයක් කඩකරන හෝ ඊට අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහකට අඩු නොවන සහ රුපියල් මිලියන එකකට වැඩි නොවන දඩයකට හෝ මාස තුනකට අඩු නොවන සහ අවුරුදු එකක් නොඉක්මවන කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(ආ) අධිකරණය විසින් ඊට අමතරව, ඒ දඩය නොගෙවා පවතින එක් එක් දිනය සඳහා රුපියල් ලක්ෂ පහක් නො ඉක්මවන නොකඩවා අය වන දඩයක් පැනවිය හැකි ය.

**පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි**

**69.** බලයලත් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් මේ පනත ප්‍රකාරව යම් වරදක් කරනු ලබන අවස්ථාවක -

(අ) ඒ බලයලත් තැනැත්තා හෝ තැනැත්තන් සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු ම;

(ආ) ඒ බලයලත් තැනැත්තා හෝ තැනැත්තන්, හවුල් ව්‍යාපාරයක් නම්, ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) ඒ බලයලත් තැනැත්තා හෝ තැනැත්තන්, හවුල් ව්‍යාපාරයක් නොවන, සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම්, ඒ මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම,

ඒ වරද සිදු කර ඇති බවට සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ඒ හවුල් ව්‍යාපාරයේ බලයලත් තැනැත්තා හෝ තැනැත්තන් හෝ ඒ සංස්ථාගත නොකළ මණ්ඩලයේ සාමාජිකයා විසින්, ඒ වරද සිය දැනුම නොමැතිව සිදු කළ බව හෝ ඔහු ඒ වරද සිදුවීම වැළැක්වීම සඳහා නිසි උද්යෝගයෙන් කටයුතු කළ බව ඔප්පු කරන්නේ නම්, ඔහු ඒ වරද සිදුකර ඇති බවට සලකනු නොලැබිය යුතු ය.

**අධිභාර සහ දණ්ඩන අයකර ගැනීම**

**70.** (1) යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාව ඔහු වෙත පනවන ලද යම් අධිභාරයක් හෝ දණ්ඩනයක් ගෙවීම පැහැර හරින අවස්ථාවක, නියම කරනු ලබන පරිදි කොමිෂන් සභාව විසින්, සිය අත්සන යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) ඒ සහතිකයේ, ගෙවිය යුතු මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තර සහ පැහැර හරින ලද තැනැත්තාගේ නම සහ ලිපිනය ඇතුළත් විය යුතු ය.

(3) ඒ සහතිකයෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින්, ඒ සහතිකය තැපැල් කිරීමෙන් දින දහහතරක් ඇතුළත, ඒ සහතිකය

අවලංගු කරන ලෙස හෝ වෙනස් කරන ලෙස ඉල්ලීමක් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය ප්‍රකාරව යම් ඉල්ලීමක් කර නැත්නම්, එසේ සහතික කරන ලද මුදල් ප්‍රමාණය, ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාවට ගෙවිය යුතු ණයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එය කොමිෂන් සභාව විසින් දිසා අධිකරණය වෙත සහතිකයක් නිකුත් කිරීම මඟින් අය කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය ප්‍රකාරව වූ ඉල්ලීමකට (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළ විය යුතු ය.

නියෝග

**71.** (1) ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී, ඒ අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාව සහ අවශ්‍ය යයි සලකනු ලබන යම් අදාළ නියාමන අධිකාරියක් විමසා, නියෝග මඟින් නියම කරනු ලැබිය යුතු බවට මේ පනතින් නියමිත හෝ නියෝග සාදනු ලැබීමට මේ පනතින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, පහත දක්වා ඇති සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් ද නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන සංවර්ධන පාලන නියෝග නියම කිරීම;

(ආ) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ජ) ඡේදයේ කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ විය යුතු, දේශීය තක්සේරු වරිපනම් සහ වෙනත් අයබදු කාණ්ඩ සහ වරිපනම් සහ වෙනත් අයබදු වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණ හඳුනා ගැනීම;

(ඇ) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ජ) ඡේදයේ කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර වස්තු, වටිනා ලෝහ හෝ භාණ්ඩ, හුවමාරු හෝ වෙළඳපොළවල් පිහිටුවීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සහ ඒවා අලෙවි කිරීමේ දී බලයලත් තැනැත්තන්ට අදාළ වන නියම සහ කොන්දේසි නිශ්චිතව දැක්වීම;

(ඇ) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (උඅ) ඡේදයේ කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සුදු ක්‍රීඩා කටයුතු සඳහා ඇති ස්ථානවල අංග ලක්ෂණ හඳුනා ගැනීම, සුදු ක්‍රීඩා කටයුතු කරගෙන යා යුතු හෝ ක්‍රියාත්මක කළ යුතු ආකාරය නිශ්චිතව දැක්වීම සහ අවශ්‍ය විය හැකි පරිදි, බලපත්‍රයක් ලබා ගැනීමේ කාර්ය පටිපාටිය සහ ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු, රාජ්‍යභාග සහ අදාළ වෙනත් කාරණා නිශ්චිතව දැක්වීම;

(ඉ) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඌඅ) ඡේදය ප්‍රකාරව, සභාධිපත්‍ය කළමනාකරණය සහ බද්ධ නිවාස අයිතිකම් යන විෂයයන් සම්බන්ධයෙන් දේපළ කළමනාකරුට පවරනු ලැබිය හැකි හෝ භාර කරනු ලැබිය හැකි කර්තව්‍ය හෝ ඒ වගන්තියේ කාර්යය සඳහා අමතර වශයෙන් නියම කරනු ලැබිය හැකි කර්තව්‍ය නිශ්චිතව දැක්වීම;

(ඊ) 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබාදීමක්, හෝ වෙනත් අනුමතයක් සඳහා වන ඉල්ලුම්පත්‍රයේ ආකෘතිය, සහ ඉල්ලීමක් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(උ) 27 වන වගන්තියේ (5) වන උපවගන්තියේ කාර්ය සඳහා, අදාළ විය හැකි කොන්දේසි නිශ්චිතව දැක්වීම;

(ඌ) 28 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා සහ ඒ ඡේදය ප්‍රකාරව නිරත වන ව්‍යාපාරයේ ස්වභාවය සැලකිල්ලට ගෙන අදාළ ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය ප්‍රදානය කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු නිශ්චිතව දැක්වීම;

(එ) 36 වන වගන්තියේ කාර්ය සඳහා, ඒ ශ්‍රී ලංකා රුපියල්, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කිරීමේ දී අදාළ වන කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(ඒ) 37 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ ශ්‍රී ලංකාවේ වාසිකයකු සමඟ ශ්‍රී ලංකාව තුළ, කොළඹ වරාය නගරයේ බල

ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාර කටයුතු කිරීමට අදහස් කරන බලයලත් තැනැත්තකුට අදාළ වන නියම සහ කොන්දේසි සහ දේශීය ආර්ථිකයේ යහපත පිණිස ශ්‍රී ලංකාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත තැනැත්තකුට හෝ සමාගමකට සපයනු ලැබිය නොහැකි හෝ සලසනු ලැබිය නොහැකි භාණ්ඩ හෝ සේවා නිශ්චිතව දැක්වීම;

(ඔ) 39 වන වගන්තියේ කාර්ය සඳහා, ශ්‍රී ලංකා රුපියල් නොවන, යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ලැබුණු මුදල් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සහ පවත්වාගෙන යනු ලබන නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට ප්‍රේෂණය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(ඕ) 40 වන වගන්තියේ කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිල්ලර වෙළඳ පහසුකම්වලින් මිලදී ගනු ලැබූ භාණ්ඩ සඳහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිට වී යන අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු විසින් ගෙවනු ලැබිය යුතු බවට නියම කරනු ලැබිය හැකි යම් අය බද්දක් සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇති භෝජනාගාර, සිනමාහල්, විනෝදාත්මක පහසුකම්, සාප්පු සවාරි පහසුකම් හෝ වාහන ගාල් කිරීමේ පහසුකම් හා සම්බන්ධ සිල්ලර වෙළඳ පහසුකම් හා සේවාවන් භාවිත කිරීමේ දී ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින් හෝ වාසිකයෙකු විසින් කරනු ලබන ගෙවීම් වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කිරීමේ දී අදාළ වන කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(ක) 41 වන වගන්තියේ (6) වන උපවගන්තියේ කාර්ය සඳහා, මේ පනත යටතේ අක්වෙරළ සමාගම් සම්බන්ධයෙන් අදාළ විය යුතු කාර්යපටිපාටිය, නියම සහ කොන්දේසි නිශ්චිතව දැක්වීම;

(ග) 44 වන වගන්තියෙන් නියම කොට ඇති පරිදි, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට කරනු ලබන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල විචක්ෂණශීලී කළමනාකරණය සහ විශ්වසනීයත්වය පවත්වාගෙන යාම

සහතික කිරීම සඳහා වන මාර්ගෝපදේශ නිශ්චිතව දැක්වීම;

(ච) 45 වන වගන්තියේ කාර්ය සඳහා, අක්වෙරළ බැංකු කටයුතුවල නිරත තැනැත්තන්ට බලපත්‍ර ප්‍රදානය කිරීම, ඒවා තාවකාලිකව අත්හිටුවීම සහ අවලංගු කිරීම, ප්‍රාග්ධන අවශ්‍යතා, සංචිත අරමුදල්, ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යාම, මූල්‍යමය සහ ක්‍රියාකාරී අවදානම් කළමනාකරණය, සමාගමේ ශ්‍රේණිගත කිරීම තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව සහ උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සීමා කිරීම් සහ දණ්ඩන නිශ්චිතව දැක්වීම;

(ජ) 52 වන වගන්තියේ කාර්ය සඳහා ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම හා සම්බන්ධ යම් වැඩිදුර මාර්ගෝපදේශ නිශ්චිතව දැක්වීම;

(ට) මේ පනතේ X වන කොටස ප්‍රකාරව, බදු දීම සඳහා හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම සඳහා සහාධිපත්‍ය කොටස් ඉදි කිරීමට අදාළ කාර්ය පටිපාටිය සහ වෙනත් අදාළ කාරණා නිශ්චිතව දැක්වීම;

(ඩ) මේ පනතේ XI වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු කාරණා නිශ්චිතව දැක්වීම;

(ණ) 64 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත, ව්‍යාපාර කටයුතුවල නිරත වීමට බලයලත් තැනැත්තකුට අවසර දී ඇති අවස්ථාවක අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය සහ අදාළ වන යම් සීමා කිරීම් නිශ්චිතව දැක්වීම; සහ

(ත) 70 වන වගන්තිය ප්‍රකාරව, යම් තැනැත්තකු විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ, අධිභාරයක් හෝ දණ්ඩනයක් ලෙස කොමිෂන් සභාවට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් නියම කිරීම.

(3) මේ පනත යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(4) මේ පනත යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක කාලසීමාවක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව රැස් නොවීම හේතු කොටගෙන ඒ නියෝගය එසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වළක්වනු ලැබුවහොත්, පසුව එළඹෙන මුල් අවස්ථාවේ දී ම එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ නියෝගය යටතේ ඊට පෙරාතුව කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු බව

**72.** මේ පනත යටතේ සාදනු ලබන යම් රීතියක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ඇතැම් පනත් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ නොවන බව

**73.** මේ පනතේ III වන උපලේඛනයේ ලැයිස්තුගත කොට ඇති පනත්, ඒ පනත්වලට විෂයය වන කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනතේ විධිවිධාන සලසා ඇති බැවින් හෝ විකල්ප නීතිමය වැඩපිළිවෙළ මේ පනතේ නිශ්චිතව දක්වා ඇති බැවින් හෝ ඒ පනත් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළට අදාළ නොවන සහ අදාළ වීම අවශ්‍ය නොවන බැවින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ නොවිය යුතු ය.

**74**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ- අර්ථ නිරූපනය

"බද්ධ නිවාස අයිතිකම් පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත අදහස් වේ;

"අදාළ ලිඛිත නීතිය" යන්නෙන්, මේ පනතේ අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව දක්වා ඇත්නම් මිස, ශ්‍රී ලංකාවේ සියලු ලිඛිත නීති අදහස් වේ;

"බලයලත් තැනැත්තා" යන්නෙන්, කොමිෂන් සභාව විසින්, සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, මේ පනත ප්‍රකාරව අවශ්‍ය වන ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් යම් අනුමතයක් නිකුත් කරනු ලැබ හෝ ප්‍රදානය කරනු ලැබ ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"බැංකු පනත" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත අදහස් වේ;

"ආයෝජන මණ්ඩල පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත අදහස් වේ;

"ආයෝජන මණ්ඩලය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදහස් වේ;

"ව්‍යාපාරය" යන්නෙන්, මේ පනතින් අවසර දෙනු ලබන පරිදි, මූල්‍යමය සේවා හෝ මූල්‍යමය නොවන සේවා සපයන ව්‍යාපාරයක් සහ අක්වෙරළ ව්‍යාපාරයක් ද ඇතුළුව ඕනෑම ආකාරයක නීත්‍යානුකූල ව්‍යාපාරයක් අදහස් වේ;

"ශ්‍රී ලංකාවේ පුරවැසියා" යන්නෙන්, (451 වන අධිකාරය වූ) පුරවැසි පනතේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු අදහස් වේ;

"පොදු ප්‍රදේශ" යන්නෙන්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති -

(අ) ඇලවල් සහ කළපු;

(ආ) උද්‍යාන සහ ප්‍රජා පහසුකම් සහිත ප්‍රදේශ; සහ

(ඇ) වෙරළ සහ භූමි දර්ශනය,

සහ පොදු ප්‍රදේශයක් ලෙස කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් යම් ප්‍රදේශයක් අදහස් වේ;

"ප්‍රජා රීති" යන්නෙන්, සහජීවනය පවත්වා ගෙන යාම තහවුරු කිරීමේ සහ සුසංයෝගී ජීවන පරිසරයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සහාධිපත්‍ය කොටස් හෝ පරිශ්‍රවල හිමිකරුවන් සහ පදිංචිකරුවන් විසින් අනුගමනය කරනු ලැබිය යුතු වූ, කොමිෂන් සභාව විසින් කලින් කල සකස් කරනු ලබන මාර්ගෝපදේශ සහ උපදෙස් නිශ්චිතව සඳහන් කරන රීති අදහස් වේ;

"සමාගම" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද යම් සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් හෝ යම් නීතියක්, අධිකාර පත්‍රයක්, ව්‍යවස්ථාවක් හෝ සමාගමක් සංස්ථාපනය කරන හෝ එසේ සංස්ථාපනය කිරීම අර්ථ දක්වන යම් සාධනපත්‍රයක් යටතේ වෙනත් යම් අධිකරණ බලප්‍රදේශයක සංස්ථාගත කරන ලද සමාගමක් ඇතුළත් වේ;

"සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත අදහස් වේ;

"සභාධිපත්‍ය කොටස" යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන ජාතික රාජ්‍ය සභාවේ බද්ධ නිවාස අයිතිකම් පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"නම් කරන ලද විදේශ ව්‍යාවහාර මුදල" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ 25 වන වගන්තියේ කාර්ය සඳහා මුදල් මණ්ඩලය විසින් "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලක්" ලෙස නිශ්චය කරනු ලබන විදේශ ව්‍යවහාර මුදලක් අදහස් වේ;

"සංවර්ධන පාලන නියෝග" යන්නෙන්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අදාළ වන්නා වූ සහ කොළඹ වරාය නගරයේ ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ සංවර්ධන අරමුණු සහ රාමුව ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා, කොමිෂන් සභාව විමසා ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන සංවර්ධන පාලන නියෝග අදහස් වේ;

"රජයේ අලෙවි කළ හැකි ඉඩම්" යන්නෙන්, රජය විසින් නේවාසික, වාණිජමය, විනෝදාත්මක, අධ්‍යාපනික, සංස්කෘතික, ප්‍රජා පාදක සංවර්ධන කටයුතු සහ ඒ හා සමාන සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ලබා දෙන කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටි ගොඩකරන ලද ඉඩම් ප්‍රමාණය අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන්, මුදල් මණ්ඩලය විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, 1988 අංක 30 දරන බැංකු පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ;

"ප්‍රධාන සැලැස්ම" යන්නෙන්, කොළඹ වරාය නගරයේ අනාගත සංවර්ධනය මාර්ගෝපදේශනය කිරීම සඳහා සංකල්පනාත්මක සැකැස්ම සපයන කොළඹ වරාය නගරයේ සැලැස්ම අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"නිර්වාසිකයා" යන්නෙන්, වාසික තැනැත්තකු නොවන තැනැත්තකු අදහස් වේ;

"අක්වෙරළ බැංකු ව්‍යාපාරය" යන්නෙන්, මේ පනතේ විධිවිධාන සලසා ඇති හෝ නියම කරනු ලැබිය හැකි පරිදි මිස, ශ්‍රී ලංකා රුපියල්වලින් හැර යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ගෙවනු ලබන, මේ පනත යටතේ අවසර දී ඇති පරිදි යම් බලයලත් තැනැත්තකු විසින් බැංකු හෝ මූල්‍යමය සේවාවන් සැපයීම අදහස් වේ;

"අක්වෙරළ ව්‍යාපාරය" යන්නෙන්, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි හෝ නියම කරනු ලැබිය හැකි පරිදි මිස, ශ්‍රී ලංකා රුපියල්වලින් හැර වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි, මේ පනත ප්‍රකාරව විධිවිධාන සලසා ඇති පරිදි බලයලත් තැනැත්තකු විසින් මූල්‍යමය සේවා ඇතුළු සේවා සැපයීම අදහස් වේ;

"තැනැත්තා" යන්නට, ස්වාභාවික තැනැත්තකු, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් අධිකරණ බලප්‍රදේශයක නීති යටතේ වලංගු ලෙස පිහිටුවා ඇති සමාගමක්, හවුල් ව්‍යාපාරයක්, සීමාසහිත හවුල් ව්‍යාපාරයක් සහ පදනමක් ඇතුළත් වේ;

"ව්‍යාපෘති සමාගම" යන්නෙන්, කොළඹ වරාය නගරය සංවර්ධනය කරන්නා අදහස් වේ;

"ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම්" යන්නෙන්, ව්‍යාපෘති සමාගම විසින් නේවාසික, වාණිජමය, විනෝදාත්මක සහ විවේකය පදනම් වූ සංවර්ධන කටයුතු සහ ඒ හා සමාන සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා, නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද ප්‍රධාන බදු ගිවිසුම් මඟින් ව්‍යාපෘති

සමාගම වෙත ලබා දෙන ලද කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටි, ගොඩ කරන ලද ඉඩම් ප්‍රමාණය අදහස් වේ;

"නියාමන අධිකාරිය" යන්නට, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ආගමන සහ විගමන පාලක ජනරාල්වරයා, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ මේ පනත හා සම්බන්ධ විෂයයන් වන්නා වූ ද, යම් ලිඛිත නීතියක් යටතේ ඒ විෂයයන් හා සම්බන්ධ බලතල, කාර්ය සහ කර්තව්‍ය පවරනු ලැබ ඇත්තා වූ හෝ භාර කොට ඇත්තා වූ ද වෙනත් යම් නියාමන අධිකාරියක් හෝ අනුමත කිරීමේ අධිකාරියක් ඇතුළත් වේ. ඒ අදාළ නියාමන අධිකාරිය, ඒ අධිකාරීවලට අදාළ වන ලිඛිත නීති කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට සීමා විය යුතු ය;

"සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව, සමාගම් ලියාපදිංචි කිරීමේ කර්තව්‍යය ක්‍රියාත්මක කරන, කරන හෝ ඉටු කරන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ වෙනත් යම් නිලධරයකු අදහස් වේ;

"වාසිකයා" යන්නට -

(අ) ශ්‍රී ලංකාවේ වාසය කරන ශ්‍රී ලංකාවේ පුරවැසියකු;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන, එහෙත් අවම වශයෙන් මාස හයක් ශ්‍රී ලංකාවේ සිටින සහ ශ්‍රී ලංකාවේ නොකඩවා සිටීමට අදහස් කරන පුද්ගලයකු;

(ඇ) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ සමාගමක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද සංස්ථාපිත මණ්ඩලයක් හෝ ශ්‍රී ලංකාව තුළ ඇති ව්‍යාපාර ආයතනයක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් සංවිධානයක්;

(ඇ) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන, යම් විදේශීය රටක නීති යටතේ පිහිටුවන ලද සමාගමක ශාඛාවක්, පාලිත සමාගමක්, අනුබද්ධිත සමාගමක්, ඒ සමාගමේ දිගුවක්, කාර්යාලයක් හෝ වෙනත් ඒකකයක් හෝ වෙනත් අධිකරණමය තැනැත්තකු,

ඇතුළත් වේ;

"සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත" යන්නෙන්, 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අදහස් වේ; සහ

"නාගරික සංවර්ධන අධිකාරිය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**75.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

I වන උපලේඛනය

(2 වන සහ 65 වන වගන්ති)

**කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපයේ බල ප්‍රදේශයේ මායිම්**

මැනුම්පති විසින් පිළියෙළ කරන ලද 2019.06.11 දිනැති අංක CO/DSO/2019/370 දරන අනුරේඛනයේ නිරූපණය කර ඇති, බස්නාහිර පළාතේ, කොළඹ, මෙහි පහත දැක්වෙන සම්බන්ධ කිරීමේ ලක්ෂ්‍යයන්හි පිහිටා ඇති සහ කැබලි අංක 2 සිට කැබලි අංක 7 ලෙස සලකුණු කොට ඇති හෙක්ටයාර් 446.6153කින් සමන්විත ''කොළඹ වරාය නගරය'' යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය පහත දැක්වෙන පරිදි මායිම් වී ඇත:-

| සම්බන්ධ වන ලක්ෂ්‍යය - කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම් | නැගෙනහිර ඛණ්ඩාංක | උතුරු ඛන්ඩාංක |
|---|---|---|
| උතුරින් සම්බන්ධ වන ලක්ෂ්‍යය | 396913.476 | 492847.764 |
| දකුණින් සම්බන්ධ වන ලක්ෂ්‍යය | 397077.037 | 492290.222 |

1. කැබලි අංක **2** : ප්‍රමාණය : හෙක්. **155.8376**

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 6 සහ 1, කොළඹ වරාය සහ චෛත්‍යය පාර; |
| නැගෙනහිරට | : | කැබලි අංක 1, කොළඹ වරාය, චෛත්‍යය පාර, ඉන්දියානු සාගරය සහ කැබලි අංක 7; |
| දකුණට | : | ඉන්දියානු සාගරය, කැබලි අංක 7, 6 සහ 3; |
| බස්නාහිරට | : | කැබලි අංක 6. 3 සහ 6. |

2. කැබලි අංක **3** : ප්‍රමාණය : හෙක්. **15.0933**

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 2; |
| නැගෙනහිරට | : | කැබලි අංක 2 සහ 6; |
| දකුණට | : | කැබලි අංක 6 සහ 4; |
| බස්නාහිරට | : | කැබලි අංක 4 සහ 6. |

3. කැබලි අංක 4 : ප්‍රමාණය : හෙක්. **113.5311**

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 6 සහ 3; |
| නැගෙනහිරට | : | කැබලි අංක 3 සහ 6; |
| දකුණට | : | කැබලි අංක 6, 5 සහ 6; |
| බස්නාහිරට | : | කැබලි අංක 6, 5 සහ 6. |

4. කැබලි අංක **5** : ප්‍රමාණය : හෙක්. **14.7856**

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 6 සහ 4; |
| නැගෙනහිරට | : | කැබලි අංක 6, සහ 4; |
| දකුණට | : | කැබලි අංක 6; |
| බස්නාහිරට | : | කැබලි අංක 6. |

**5**. කැබලි අංක **6** : ප්‍රමාණය : හෙක්. **101.1038**

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 7, 1, 2, 3, 4, 5, 4, 3 සහ 2; |
| නැගෙනහිරට | : | කැබලි අංක 1, 2, 3, 4, 5, 2 සහ 7; |
| දකුණට | : | කැබලි අංක 2 සහ 7; |
| බස්නාහිරට | : | කැබලි අංක 2 සහ 7. |

**6**. කැබලි අංක **7** : ප්‍රමාණය : හෙක්. **46.2639**

| | | |
|---|---|---|
| උතුරට | : | ඉන්දියානු සාගරය, කැබලි අංක 1, 6 සහ 2; |
| නැගෙනහිරට | : | කැබලි අංක 1, 6 සහ 2 සහ ඉන්දියානු සාගරය; |
| දකුණට | : | ඉන්දියානු සාගරය; |
| බස්නාහිරට | : | ඉන්දියානු සාගරය. |

II වන උපලේඛනය

(52 වන සහ 53 වන වගන්ති)

**නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කරනු ලැබිය හැකි පනත්**

1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත
2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත
3. 2002 අංක 11 දරන මුදල් පනත
4. 2005 අංක 5 දරන මුදල් පනත
5. 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත
6. 2002 අංක 16 දරන හරබදු පනත
7. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත
8. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත
9. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත
10. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත
11. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
12. (267 වන අධිකාරය වූ) විනෝද බදු පනත
13. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත
14. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත

III වන උපලේඛනය

(73 වන වගන්තිය)

**කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ නොවන පනත්**

1. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත
2. (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනත
3. 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත
4. (269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත
5. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත
6. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත
7. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත